# වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් - 2023
# නුවරඑළිය දිස්ත්‍රික්කය

## வருடாந்த செயலாற்றுகை அறிக்கையும் கணக்குகளும் - 2023
## நுவரெலியா மாவட்டம்

# Annual Performance Report & Accounts – 2023
# Nuwara Eliya District



**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය**

**மாவட்ட செயலகம் - நுவரெலியா**

**District Secretariat –Nuwara Eliya**

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය

වැය ශීර්ෂ අංකය - 260

## අන්තර්ගතය

පරිච්ඡේද 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේද 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේද 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේද 04 - කාර්යසාධන දර්ශකය

පරිච්ඡේද 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේද 06 – මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේද 07 - අනුකූලතා වාර්තාව

# 01 පරිච්ඡේදය- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැදින්වීම

### 1.2 දිස්ත්‍රික් මායිම් හා භූගෝලීය පසුබිම

ශ්‍රී ලංකාවේ පියස්ස යැයි විරුදාවලි ලබන නුවරඑළිය දිස්ත්‍රික්කය මහනුවර, බදුල්ල, කෑගල්ල, හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්ට මායිම්ව, මධ්‍යම පලාතේ පිහිටා ඇත. මුහුදු මට්ටමේ සිට අඩි 900 සිට අඩි 8000 දක්වා උසට විහිදී යන ශ්‍රී ලංකාවේ උසම කන්ද වන පිදුරුතලාගල කන්ද මෙන්ම කිරිගල් පොත්ත කන්ද, කොටුපොල කන්ද , කිකිළියාමාන කන්ද, ග්‍රේඩ් වෙස්ටන් කන්ද ,හග්ගල කන්ද හා අති පූජණීය සමනල කන්ද ආදී කඳු පන්තිද නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත.

එසේම ලක්ෂපාන ඇල්ල, ඩෙවෝන් ඇල්ල, ඇල්ජින් ඇල්ල, සෙන්ට් ක්ලේයා ඇල්ල, රම්බොඩ ඇල්ල, බේකස් ඇල්ල, කුරුඳු ඇල්ල, ගැරඩි ඇල්ල ආදියත් මහවැලි හා කැළණි ගංගාවල ආරම්භයත් එසේම දෙස් විදෙස් ප්‍රචලිත හෝර්ටන් තැන්න අභය භූමියත්, හග්ගල උද්‍යානයත් මෙහි පිහිටා තිබීම සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට හේතුවී තිබේ. එසේම ශ්‍රී ලංකාවේ ජලවිදුලි බල උත්පාදනයට ප්‍රමුඛත්වයක් ගන්නා මාවුස්සා කැලේ, කාසල්රී, කැනියොන්, නෝර්ටන්බ්‍රිජ්, කොත්මලේ,රන්දෙණිගල යන ජලාශද, වික්ටෝරියා ජලාශයෙන් වැඩි කොටසක්ද පිහිටා ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළය.

ජනගහනයෙන් 57.1% ක් පමණ ශ්‍රී ලංකා දෙමළ වන අතර, ඉතිරිය සිංහල හා අනෙකුත් ජාතීන්ගෙන් සමන්විත වේ. දිස්ත්‍රික්කයේ පවතින විශේෂිත දේශගුණික තත්වය කෘෂි කර්මාන්තයට හිතකර වන අතර වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ එළවළු බෝග වගාව සඳහාය.

වර්ග කිලෝ මීටර් 1741 ක විශාලත්වයකින් යුක්ත මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය වර්ෂාපතනය අගල් 75 ක් පමණ වන අතර, ලංකාවේ වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය (වටවල) මෙන්ම අවම උෂ්ණත්වය වාර්තා වන ප්‍රදේශයද (නුවරඑළිය) මෙම දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබීම විශේෂත්වයකි.



### 1.1.2 දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම හා එහි වැදගත්කම

ක්‍රි.ව. 1819 දී ඉංග්‍රීසි ජාතික ජෝන් ඩේවි විසින් නුවරඑළිය සොයා ගැනීමේ ඓතිහාසික සිද්ධියෙන් පසු පුංචි එංගලන්තය යන විරුදාවලියෙන් නුවරඑළිය හඳුන්වනු ලැබිණ. ස්වකීය සුඛවිහරණය පිණිස බෝග වගාවටත්, සංචාරක මධ්‍යස්ථානයක් ලෙසත් ඉන් අනතුරුව පරිපාලන ඒකකයක් ලෙසත් නුවරඑළිය සුදු ජාතිකයන්ගේ ආදරය දිනා ගත් දෙවන මව් බිමක් බවට පත්විය. ඒ සඳහා හේතු වූයේ නුවරඑළියේ පැවැති දේශගුණික තත්ත්වයන් සිය මව් රටේ දේශගුණික තත්ත්වයන් හා සමපාත වීමයි.

ඒ නමුත්, ජනප්‍රවාද හා ලේඛන ගත ඓතිහාසික සාධකයන්ට අනුව නුවරඑළිය දිස්ත්‍රක්කයේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවේ. ඒ සඳහා හෝටන් තැන්න සුවිශේෂි පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථානයක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම කඳුකරයේ ජනාවාස ව්‍යාප්තව පැවැති එක් කලාපයක් ලෙස හෝටන්තැන්න පුරාවිද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට ලක්වූ ප්‍රදේශයකි.

ශ්‍රී ලංකාදීපයේ ඉඩයිම් පොතට අනුව රුහුණු, මායා, පිහිටි යන ත්‍රිසිංහලයේ රුහුණු රටට අයත් රටවල් 42ක් වූ බවත්, කොත්මලේ රට, මතුරට, ගොඩ රට, සගම, කටුබුළු රට, මිනිපේ යන රටවලින් කිහිපයක් නුවරඑළියට අයත් බවත් එහි සඳහන් වේ.

වර්තමානයේ නුවරඑළිය තේ වගාවෙන් පිරි වාණිජමය ස්වරූපයක් ගත්තේ වී නමුත්, පුරාණයේ අලි ඇතුන්ගෙන් පිරි වනාන්තරයක් වූ බව කියැවේ. වලපනේ, හඟුරන්කෙත, කොත්මලේ, නුවරඑළිය, මස්කෙළිය යන මැතිවරණ කොට්ඨාශයන්ගෙන් සමන්විත කන්ද උඩරට තෙත්බිම වූයේ නුවරඑළිය දිස්ත්‍රික්කයයි. පුරාණ රජවරු මෙම කලාපය සංකීර්ණ ජනාවාස බවට පත් නොකරනු ලැබුයේ ආරක්ෂක භූමියක් ලෙසත්, වර්ෂාපතනය සහිත ජලජ මූලාශ්‍රයක් ලෙසත් භාවිතයට ගැනීම නිසාවෙනි.

ඓතිහාසික සාධක හමු නොවන මුත්, රාවණා පුරාවෘත්තයට නුවරඑළියේ ඉතිහාසය සම්බන්ධයෙන් විශේෂ ස්ථානයක් හිමි වේ. ජනප්‍රවාදවලට අනුව, ප්‍රාග් ඓතිහාසික යුගයේ රාවණ රජු බඳුලු ප්‍රදේශය සිය අගනුවර කර ගත් බවත්, එම පාලන ප්‍රදේශයට නුවරඑළිය අයත් වූ බවත්, රාවණ රජු සීතාවන් පැහැර ගෙන පැමිණීමෙන් පසු ඇය වලපනේ පරණගම ප්‍රදේශයේ එනම්, වර්තමාන රන්දෙණිගල ජලාශ්‍රයට යටවී ඇති ස්ත්‍රීපුර කන්දේ ගල්ගුහාවක සඟවා තැබූ බවත් කියැවේ. එහි වාතාශ්‍රය හා හිරු එළිය නොලැබීම හේතුවෙන් සීතා දේවියට ඇස් රෝගයක් හට ගැනින. එබැවින් ඇය හිරු එළිය දැකීම පිණිස රැගෙන ආ ප්‍රදේශය සීතා එලිය වූ බවත්, මේ දරුණු වියෝගයෙන් සීතාවන් වැළපුණු ප්‍රදේශය වලපනය වූ බවත් ජනප්‍රවාදයේ එයි.

එසේම විජය රජු විසින් කුවේණිය පළවා හැරීමෙන් පසු ඇය සිය දරු දෙදෙනා සමඟ පලාවිත් කොත්මලේ දොරගල හා යකිනිගල ප්‍රදේශවල වාසය කළ බව කියැවෙන තවත් ජනප්‍රවාදයක් වේ. යක්ෂ ගෝත්‍රිකයන් විසින් ඇය මරා දැමීමෙන් පසු ඇයගේ දරු දෙදෙනා සමනල අඩවිය වෙත පළා ගොස් දිවි ගෙවූ බවත්, ඔවුන්ගෙන් වැදි ජනතාව පැවැත එන බවත් තවදුරටත් විස්තර වේ.

හඟුරන්කෙත, වලපනේ, කොත්මලේ ප්‍රදේශය ඓතිහාසික ලේඛන ගත සාක්ෂි සහිත නිශ්චිත ඉතිහාසයකට උරුමකම් ඇති ප්‍රදේශයන්ය. මෙම ප්‍රදේශ ආශ්‍රිතව විවිධ ස්ථාන නාම ඓතිහාසික සංසිද්ධීන් හා නිතරතුරුවම සාකච්ඡා වී තිබීම ඊට කදිම නිදර්ශන වේ. අනුරාධපුර නගරය ආරම්භ කළ පණ්ඩුකාභය කුමරු සිය යුද්ධ සංවිධාන කටයුතුවල දී දොළුගල ප්‍රදේශය යොදා ගත් බව මහාවංශයේ සඳහන් වේ. එම ස්ථානය හඟුරන්කෙත දොළුගල ප්‍රදේශය විය හැකි බව විශ්වාස කෙරේ.

එසේම දුටුගැමුණු රජු හා කොත්මලේ ප්‍රදේශය ගැනද පවතින්නේ සුවිශේෂී ඉතිහාසයකි. දුටුගැමුණු කුමරු සිය රාජාභිෂේකයට ප්‍රථම ශ්‍රී ලංකාද්වීපය එක්සේසත් කරනු පිණිස එළාරට විරුද්ධව සේනා සංවිධානය කරනු ලැබුයේ කොත්මලේ ප්‍රදේශයේ රැදෙමිනි. එසේම කාවන්තිස්ස රජතුමා විසින් සුපුල්පිටිය විහාරයේ සතලිස් මහාබෝධි අංකුරයක් රෝපණය කළ බව කියැවේ.

ක්‍රි. පූ. 103 දී වළගම්බා රජු තමා වෙත එල්ල වූ සතුරු ආක්‍රමණ හමුවේ වලපනේ ප්‍රදේශයට පළා ආ රජු ආරක්ෂාව පිණිස රැඳී සිටි සමයේ යටිමාදුර, විල්වල, අරත්තන, කඩදොර වැනි රජ මහා විහාර කරවා ඇති බව මහාවංශයේ සඳහන් වේ. පොළොන්නරු යුගයේ විජයබාහු රජතුමා ශ්‍රී පාදස්ථානයේ හා ශ්‍රී පාද වන්දනා කරනු ලබන මඟීන්ගේ නඩත්තුව සඳහා ගම්වරයක් ලබා දී ඒ බව අඹගමුවේ සෙලක කොටවා ලේඛන ගත කර තිබේ. වර්තමානයේ අඹගමුව සෙල්ලිපිය නමින් හඳුන්වන්නේ එම ලිපියයි.


එසේම ක්‍රි.ව. 1215 – 1236 දක්වා පොළොන්නරු රාජධානි සමයේ කාලිංග මාඝ ආක්‍රමණයත් සමඟ වෙහෙර විහාර විනාශ කිරීම හේතුවෙන් වාචිස්සර හිමියන් ප්‍රමුඛ භික්ෂූණ් වහන්සේලා දළදාව හා පාත්‍රා ධාතූන් වහන්සේලාගේ ආරක්ෂාව පතා කොත්මලේ ප්‍රදේශයට වැඩම කරවූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ.


දඹදෙණි යුගයේ දී තුන්වන විජයබාහු රජතුමා දළදා වහන්සේගේ ආරක්ෂාව පතා බෙලිගල ප්‍රදේශට වැඩම කරවූ බව සඳහන්ය. නැවත දළදා වහන්සේ සිය රාජධානියට වැඩම කරවීමට පැමිණි විජයබාහු රජු නවාතැන් ගත් ස්ථානය දිඹුල කන්ද වර්තමානයේ විජේබාකන්ද ලෙසත්, පෙරහැර නියම කරගත් ගම්දොර නියම්ගම්දොර ලෙසත්, පෙරහැරට මල් සපයාගත් ගම මල්දෙණිය ලෙසත් ව්‍යවහාරයට පැමිණ ඇති බව ප්‍රදේශවාසීන්ගේ විශ්වාසයයි. එසේම සීතාවක රාජසිංහ රජු ශිව ආගම වැළඳ ගැනීමෙන් පසු අරිට්ඨකී වෙන්ඩු පෙරුමාල් වෙත කොත්මලේ ප්‍රදේශය පවරා දුන් බව කියැවේ.

කන්ද උඩරට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වීමෙන් අනතුරුව නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් වලපනේ, කොත්මලේ, හඟුරන්කෙත යන ප්‍රදේශ ක්‍රමයෙන් ජනාවාස බවට පත්විය. එම ප්‍රදේශ රජුගේ ඍජු පාලනයට යටත් දිසාවන් බවට පත් වූ බව ඓතිහාසික සාක්ෂි අනුව පැහැදිවේ. විලමධර්මසූරිය රජුට වලපනේ ප්‍රදේශය ඍතුගීසීන්ගෙන් ආරක්ෂා සැපයූ ආරක්ෂක මධ්‍යස්ථානයක් විය. පසුව රජු එහි වූ මළුවේගොඩ රජමහා විහාරය ප්‍රතිසංස්කරණ කළ බවත්, එතුමා විසින් මාළිගාතැන්නෙහි රජ මාළිගයක් ඉදිකළ බවත් ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. ක්‍රි.ව. 1635 – 1687 දක්වා රජ කළ දෙවන රාජසිංහ රජතුමා හට ද කොත්මලේ හරංගල, වලපනේ රාසිංගල ප්‍රදේශය ආරක්ෂා සැපයූ ප්‍රදේශ වශයෙන් සඳහන් වන අතර, එවකට දියතිලක පුරය ලෙසින් හැඳින්වූ මෙම ප්‍රදේශය හඟුරන්කෙත ලෙස ව්‍යවහාරයට ලක් කරනු ලැබුයේ මෙම රජතුමා විසින් බව කියැවේ. ක්‍රි. ව. 1744 – 1782 දක්වා රජ කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ඕලන්ද ආක්‍රමණවලින් ආරක්ෂා කිරීම පිණිස හඟුරන්කෙත අරත්තන රජමහා විහාරයේ දළදා වහන්සේ සඟවා තැබූ බවත්, ඉන් පසු එම විහාරය මුල් කර ගනිමින් දළදා වහන්සේට පූජෝපහාරයක් ලෙස පෙරහැරක් ආරම්භ කළ බවත්, පසුව එම පෙරහැර හඟුරන්කෙත ඇසළ පෙරහැර වශයෙන් හැඳින් වූ බවත් සඳහන්ය. මෙම ප්‍රදේශයන් විටින් විට රජවරුන් වෙත ආරක්ෂා සැපයූ අතර අනු පරිපාලන ඒකක ලෙස පැවැති ආකාරය මන්දාරම්පුවත හා යටත් විජිත යුගයේ බ්‍රිතාන්‍ය ලේඛනවලින් හොඳින් තහවුරු වේ. 1803 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිය පරිවාර ස්ත්‍රීන් ද සමඟ හඟුරන්කෙත ප්‍රදේශයට පැමිණ මාළිගයක් කරවා එහි වාසය කළ බව සඳහන් වේ.

වර්ෂ 1818 දී ඉංග්‍රීසි ජාතිකයන්ට විරුද්ධව ඇති කරනු ලැබූ කැරැල්ලේ දී සර් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් වලපනේ දිසාපති තනතුරට දූල්ලෑව පත්කර එවීමෙන් අනතුරු සිංහල කැරලිකරුවන් විසින් අභිනව නිලධාරීයා පලවා හැර වලපනේ දිසාව නියෝජන කළ මොණර කොඩිය කැබලිවලට ඉරා විනාශ කළ බව සඳහන් විමෙන් වලපනේ වෙනම පරිපාලන ඒකකයක් වශයෙන් මහනුවර රාජධානි සමයේ දී පැවැති බව තහවුරු වේ.

### 1.1.3 දිස්ත්‍රික් සිතියම




Divisional Secratariats of Nuwara-Eliya District
N
Ambagamuwa
Haguranketha
Kothmale East
Nildandahinna
Kothmale West
Mathurata
Norwood
Walapane
Nuwara Eliya
Talawakelle
0 8,000 16,000 32,000 48,000 64,000
Kilometers

| ඉඩම් පරිහරණය අනුව බිම් ප්‍රමාණය | | |
|---|---|---|
| | | |
| | ප්‍රමාණය(වර්ග කිලෝමීටර්) | ප්‍රතිශතය |
| ගොඩබිම් ප්‍රමාණය | 1,690.2 | 97.08 |
| අභ්‍යන්තර ජලාශ | 50.8 | 2.92 |
| මුළු බිම් ප්‍රමාණය | 1,741.0 | 100.00 |
| වගා කල මුළු බිම් ප්‍රමාණය | 737.3 | 42.35 |
| වගා නොකල මුළු බිම් ප්‍රමාණය | 274.4 | 15.76 |
| වනාන්තර මුළු බිම් ප්‍රමාණය | 729.2 | 41.89 |
| මුළු බිම් ප්‍රමාණය | 1,741.0 | 100.00 |
| මූලාශ්‍රය -දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය, නුවරඑළිය | | |

### 1.1.4 දිස්ත්‍රික්කයේ පොදු දත්ත

| අනු අංකය | අවශ්‍ය දත්ත | සංඛ්‍යාව/වටිනාකම/ විස්තර | |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික්කය | නුවරඑළිය | |
| 02 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණන | 07 | |
| 03 | සීමා නිර්ණය අනුව යෝජිත ප්‍රාදේශිය ලේකම් කාර්යාල සංඛ්‍යාව | 10 | |
| 04 | ග්‍රාම නිලධාරී වසම් ගණන | 491 | |
| 05 | ජනගහනය | 780,000 | |
| 06 | ජන්ද දායකයින් සංඛ්‍යාව | 569,028 | |
| 07 | මහ නගර සභා | 01 | |
| 08 | නගර සභා | 02 | |
| 09 | ප්‍රදේශීය සභා ගණන | 09 | |
| 10 | පාර්ලිමේන්තු මන්ත්‍රී ආසන ගණන | 08 | |
| 13 | දිස්ත්‍රික් ජනතාවගේ ජීවනෝපාය/වෙළෙඳ රටාවන් (කෙටියෙන්) | වැවිලි කර්මාන්ත ආශ්‍රිත රැකියා හා කෘෂි කර්මාන්තය | |
| 13<br>14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය | **අනුමත** | **සත්‍ය** |
| | | 1,455 | 1,354 |
| 15 | **සංචාරක බංගලා / නිවාඩු නිකේතන**<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ | 01 | |
| 16 | **සංචාරක බංගලා / නිවාඩු නිකේතන**<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ | 02 | |

### 1.1.5 ජන්ද කොට්ඨාස අනුව ලියාපදිංචි ජන්ද දායකයින් සංඛ්‍යාව 2022

| අනු අංකය | ජන්ද කොට්ඨාස | ලියාපදිංචි ජන්ද දායකයින් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කොත්මලේ | 86,040 |
| 2 | හඟුරන්කෙත | 76,955 |
| 3 | වලපනේ | 89,153 |
| 4 | නුවරඑළිය මස්කෙලිය | 336,702 |
| 5 | එකතුව | 588,850 |

## 1.2 ආයතනයේ දැක්ම,

දැක්ම

එලදායි පුරවැසියෙක්,සතුටින් ජීවත්වන පවුලක්,විනය ගරුක සමාජයක් හා සෞභාග්‍යමත් දිස්ත්‍රික්කයක්.

මෙහෙවර

දිස්ත්‍රික්කයේ ජනතාවගේ අපේක්ෂාවන් මුදුන්පත් වන ආකාරයෙන් දිස්ත්‍රික්කයේ මානව හා භෞතික සම්පත් කළමනාකරණයේ පුරෝගාමියා ලෙස කටයුතු කරමින්,රාජ්‍ය අරමුදල් සැලසුම් සහගතව හා තිරසාරව ආයෝජනය කරවීම සහතික කිරීම සඳහා දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සම්බන්ධීකරණය කරමින් අවශ්‍යතාවය මත උපදෙස් හා මග පෙන්වීම ලබාදීමත්,ජනතාවගේ ජීවනෝපාය,ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම ඉලක්ක කරමින් ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතික ආර්ථිකයට ඉහල දායකත්වයක් ලබාදීම සහ එයට සමගාමීව දිස්ත්‍රික්කය තුළ සමාජ සහජීවනය හා සංහිඳියාව ගොඩනැංවෙන අයුරින් අවශ්‍ය ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම.

## අරමුණු


- පුද්ගලික හා රාජ්‍ය අංශයේ සක්‍රීය දායකත්වය තුලින් කාර්යක්ෂම මහජන සේවාවක් නිර්මාණය
- විවිධ වූ සමාජ ආර්ථික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම,අධීක්ෂණය හා කළමණාකරනය
- සංස්කෘතික විශ්වසනීයත්වය, විවිධත්වය හා සමානාත්මතාවය සඳහා පෙළඹවීම
- කොට්ඨාස අතර සන්නිවේදනය හා සහයෝගීතාවය වර්ධනය තුලින් රාජ්‍ය ප්‍රතිපත්ති කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම

## 1.3 ප්‍රධාන කාර්යයන්

- රජයේ කාර්යභාරය ඉටුකිරිම සඳහා අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය.
- මධ්‍යම රජයේ හා පළාත් සභා වෙනුවෙන් අනුමත ආදායම් රැස්කිරීම
- දිස්ත්‍රික්කයේ සියළු ප්‍රාදේශිය ලේකම් කාර්යාල අධීක්ෂණය, සම්බන්ධීකරණය හා පාලනය
- අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු සහ පළාත් සභා වලට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම
- විමධ්‍යගත අරමුදල් හා අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ලැබෙන අරමුදල් යොදා ගනිමින් දිස්ත්‍රික්කය තුල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය,ආගමික හා සංස්කෘතික උත්සව හා ක්‍රියාකාරකම් දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක කිරිම
- රාජ්‍ය ආයතන,සිවිල් සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කර ගැනීම තුලින් සමාජ ගැටළු විසඳීම සඳහා මැදිහත්වීම

## 1.4 සංවිධාන සටහන

# සංවිධාන සටහන
# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
# නුවරඑළිය



## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි ඉලක්ක

### 2.1 විශේෂ ජයග්‍රහණ,අභියෝග හා ඉදිරි ඉලක්ක

#### 2.1.1 විශේෂ ජයග්‍රහණ

1. **"නුවරඑළියට වසන්තය"** වැඩසටහන යටතේ ඇති ව්‍යාපෘතියක් වන "Helping Nuwara Eliya" වැඩසටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා උදව් කිරීමට කැමති හා හැකියාවක් ඇති පුද්ගලයන් හා ආයතන සම්බන්ධකර ගැනීම හා සහයෝගය අවශ්‍ය පාර්ශව හා අංශ වෙත සම්බන්ධ කිරීමේ කටයුතු සිදුකිරීම

#### 2.1.2 අභියෝග

1. ස්වභාවික ආපදා බහුල වීම
2. භූවිෂමතාවය
3. සංවර්ධන කටයුතු සඳහා රජයේ ඉඩම්වල පවතින හිඟය
4. සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය තාක්ෂණික නිලධාරීන්ගේ (සිවිල්) හිඟය

#### 2.1.3 ඉදිරි ඉලක්ක

1. "නුවරඑළියට වසන්තය" වැඩසටහන යටතේ ඇති ව්‍යාපෘති 20ක් සාර්ථකව ක්‍රියාත්මක කරීම තුලින් 2025 වන විට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සංවර්ධනය ඉහල ස්ථානයකට ඔසවා තැබීම

ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ.නන්දන,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය

ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ. නන්දන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය.

## 03 පරිච්ඡේදය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තථ්‍ය 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| | ආදායම් නොවන ලැබීම් | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 2,656,491,085 | 2,499,736,000 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 194,872,854 | 222,970,243 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 41,720,047 | 36,648,939 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **2,893,083,985** | **2,759,355,182** | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **2,893,083,985** | **2,759,355,182** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | **14,507,157** | **74,481,400** | |
| - | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | **2,878,576,829** | **2,684,873,782** | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | | ඒසීඒ-2(ii) |
| 575,370,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 518,192,695 | 498,923,625 | ඒසීඒ-2(ii) |
| 114,230,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 103,154,492 | 82,987,406 | ඒසීඒ-2(ii) |
| 13,206,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 12,147,607 | 2,075,012 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **702,806,000** | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **633,494,794** | **583,986,043** | |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| | මූලධන වියදම් | | | | |
| 13,800,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 10,830,968 | 13,893,965 | ඒසීඒ-2(ii) |
| 3,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 2,931,982 | 3,971,948 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 1,200,000 | හැකියා වර්ධනය | 14 | 681,129 | 997,742 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම | 15 | - | 318,129,130 | ඒසීඒ-2(ii) |
| **18,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **14,444,079** | **336,992,786** | |
| | තැන්පතු ගෙවීම | | 239,053,161 | 278,840,859 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම | | 41,872,910 | 45,104,031 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **280,926,071** | **323,944,890** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **928,864,944** | **1,244,923,718** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **1,949,711,885** | **1,439,950,064** | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 1,948,811,007 | 1,439,049,185 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 900,878 | 900,878 | ඒසීඒ-3 |
| | | | **1,949,711,885** | **1,439,950,064** | |

## 2023 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,673,417,615 | 2,555,759,286 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 116,789,855 | 116,636,991 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 900,878 | 900,878 |
| **මුළු වත්කම්** | | **2,791,108,348** | **2,673,297,155** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (48,640,633) | (92,973,804) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,673,417,615 | 2,555,759,286 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 165,430,488 | 209,610,795 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 900,878 | 900,878 |
| **මුළු වගකීම්** | | **2,791,108,348** | **2,673,297,155** |

පිටු අංක 9 සිට 25 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 56 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : ප්‍රදීප් යසරත්න | නම : ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ. නන්දන | නම : පී.ඒ.ඩී.දමයන්ති |
| තනතුර : ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | තනතුර : දිස්ත්‍රික් ලේකම් නුවරඑළිය | තනතුර : ප්‍රධාන ගණකාධිකාරී, දිස්ත්‍රික් ලේකම් කාර් යාලය, නුවරඑළිය |
| දිනය : 19/02/2024 | දිනය : | දිනය : 2024 .02 .12 |

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05

ජී.කේ.ජී.ඒ.ආර්.පී.කේ. නන්දන
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය.

පී. ඒ. ඩී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 113,341,582 | 139,857,235 |
| අග්‍රිම ලැබීම් | 2,656,491,085 | 2,499,736,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 58,507,953 | 52,298,772 |
| තැන්පතු ලැබීම් | 194,872,854 | 222,999,193 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **3,023,213,473** | **2,914,891,200** |
| | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 620,374,862 | 581,610,791 |
| සහනාධාර සහ මාරුකිරීම් | 12,147,607 | 2,075,012 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,049,149,229 | 1,573,478,568 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 14,507,157 | 74,481,400 |
| අත්තිකාරම් ගෙවීම් | 73,746,889 | 67,620,075 |
| තැන්පතු ගෙවීම් | 239,080,011 | 278,842,959 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,009,005,754** | **2,578,108,804** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **14,207,719** | **336,782,396** |
| | | |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 236,360 | 210,390 |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **236,360** | **210,390** |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තතාය 2023 | 2022 |
|---|---|---|
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම | 14,444,079 | 336,992,786 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **14,444,079** | **336,992,786** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | **(14,207,719)** | **(336,782,396)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ) | **(0)** | **0** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | **(0)** | **0** |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | **900,878** | **900,878** |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | **900,878** | **900,878** |

## වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

ඒසීඒ -2

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 692,000,000 | 10,806,000 | - | 702,806,000 | 633,494,794 | 69,311,206 |
| | (2) ප්‍රාග්ධන | 18,000,000 | - | - | 18,000,000 | 14,444,079 | 3,555,921 |
| | උප එකතුව | **710,000,000** | **10,806,000** | - | **720,806,000** | **647,938,873** | **72,867,127** |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | - | - | - | - | - | - |
| | (2) ප්‍රාග්ධන | - | - | - | - | - | - |
| | උප එකතුව | - | - | - | - | - | - |
| | මුළු එකතුව | **710,000,000** | **10,806,000** | - | **720,806,000** | **647,938,873** | **72,867,127** |

(අත්සන)

.................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2024.02.12

පී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.



ඒසීඒ - 2(i)

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | (5) | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7) | මු.රෙ. 66/69 මාරුකිරීම් (8) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| පුනරාවර්තන වියදම් | | | | | | | | | | | |
| <u>පුද්ගල පඩිනඩි</u> | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | 378,000,000 | - | - | 378,000,000 | 334,708,494 | - | | | - | | 334,708,494 |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | 10,000,000 | - | 370,000 | 10,370,000 | 9,768,964 | - | | | - | | 9,768,964 |
| 1003 වෙනත් දීමනා | 187,000,000 | - | - | 187,000,000 | 173,715,238 | - | | | - | | 173,715,238 |
| <u>ගමන් වියදම්</u> | | | | | | | | | | | |
| 1101 දේශීය | 12,000,000 | - | - | 12,000,000 | 11,046,889 | - | | | - | | 11,046,889 |
| 1102 විදේශීය | - | - | 124,215 | 124,215 | 124,215 | - | | | - | | 124,215 |
| <u>සැපයීම්</u> | | | | | | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 12,500,000 | - | 2,300,000 | 14,800,000 | 14,028,884 | - | | | - | | 14,028,884 |
| 1202 ඉන්ධන | 16,000,000 | - | - | 16,000,000 | 14,434,174 | - | | | - | | 14,434,174 |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | 2,100,000 | - | - | 2,100,000 | 1,771,856 | - | | | - | | 1,771,856 |
| <u>නඩත්තු වියදම්</u> | | | | | | | | | | | |
| 1301 වාහන | 12,500,000 | - | - | 12,500,000 | 10,388,624 | - | | | - | | 10,388,624 |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 3,800,000 | - | - | 3,800,000 | 3,132,914 | - | | | - | | 3,132,914 |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 12,000,000 | - | (2,924,215) | 9,075,785 | 8,052,309 | - | | | - | | 8,052,309 |
| <u>සේවා</u> | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | 2,000,000 | - | (370,000) | 1,630,000 | 1,352,221 | - | | | - | | 1,352,221 |
| 1402 තැපැල් හා සන්නිවේදන | 8,200,000 | - | - | 8,200,000 | 7,245,429 | - | | | - | | 7,245,429 |
| 1403 විදුලිය හා ජලය | 8,500,000 | - | 500,000 | 9,000,000 | 8,260,141 | - | | | - | | 8,260,141 |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 1,000,000 | - | - | 1,000,000 | 801,471 | - | | | - | | 801,471 |
| 1409 වෙනත් | 24,000,000 | - | - | 24,000,000 | 22,515,366 | - | | | - | | 22,515,366 |
| <u>මාරුකිරීම්</u> | | | | | | | | | | | |
| 1504 සංවර්ධන සහනාධාර | - | 10,806,000 | - | 10,806,000 | 10,331,673 | - | | | - | | 10,331,673 |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 2,400,000 | - | - | 2,400,000 | 1,815,934 | - | | | - | | 1,815,934 |
| මුළු එකතුව | **692,000,000** | **10,806,000** | - | **702,806,000** | **633,494,794** | - | - | - | - | - | **633,494,794** |

ඒසීඒ - 2(i)

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වැය විෂයය | වැඩසටහන (1) ප්‍රතිපාදනය: අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරුකිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම (5) | වැඩසටහන (2) ප්‍රතිපාදනය: අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7) | මු.රෙ. 66/69 මාරුකිරීම (8) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8) | වියදම (10) | මුළු වියදම (11)=(5)+(10) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මූලධන වියදම් | | | | | | | | | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | | | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම | 9,000,000 | - | - | 9,000,000 | 7,330,925 | - | | | - | | 7,330,925 |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 800,000 | - | - | 800,000 | 676,300 | - | | | - | | 676,300 |
| 2003 වාහන | 4,000,000 | - | - | 4,000,000 | 2,823,743 | - | | | - | | 2,823,743 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | | | | | | | | |
| 2101 වාහන | - | - | - | - | - | - | - | - | - | - | - |
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,000,000 | - | - | 1,000,000 | 957,435 | - | - | - | - | - | 957,435 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | - | - | 1,000,000 | 974,547 | - | - | - | - | - | 974,547 |
| 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම | 1,000,000 | - | - | 1,000,000 | 1,000,000 | - | - | - | - | - | 1,000,000 |
| හැකියා වර්ධනය | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | 1,200,000 | - | - | 1,200,000 | 681,129 | - | - | - | - | - | 681,129 |
| වෙනත් මූලධන වියදම් | | | | | | | | | | | |
| 2509 වෙනත් | - | | | - | - | - | | | - | | - |
| මුළු එකතුව | **18,000,000** | - | - | **18,000,000** | **14,444,079** | - | - | - | - | - | **14,444,079** |
| | | | | | | | | | - | | |
| මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව | **710,000,000** | **10,806,000** | - | **720,806,000** | **647,938,873** | - | - | - | - | - | **647,938,873** |

..............................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024 . 02 . 12

පී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.



ඒසීඒ-2(ii)

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වැය විෂයය | සටහන | මූලාශ්‍ර සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| වැඩසට./ව්‍යාප./උප ව්‍යාප./වැය විෂයය අංකය | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | | | | | | | | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | | 11 | 378,000,000 | - | - | 378,000,000 | 334,708,494 | - | 334,708,494 | 43,291,506 | 11 | පුරප්පාඩු වූ තනතුරු නොපිරවීම. |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | | 11 | 10,000,000 | - | 370,000 | 10,370,000 | 9,768,964 | - | 9,768,964 | 601,037 | 6 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම. |
| 1003 වෙනත් දීමනා | | 11 | 187,000,000 | - | - | 187,000,000 | 172,742,913 | 972,325 | 173,715,238 | 13,284,762 | 7 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ පුරප්පාඩු වූ තනතුරු නොපිරවීම |
| එකතුව | | | **575,000,000** | - | **370,000** | **575,370,000** | **517,220,370** | **972,325** | **518,192,695** | **57,177,305** | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | | | | | | | | | | | |
| ගමන් වියදම් | | | | | | | | | | | | |
| 1101 දේශීය | | 11 | 12,000,000 | - | - | 12,000,000 | 11,046,889 | - | 11,046,889 | 953,111 | 8 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ ගමන් වියදම් පාලනය කිරීම. |
| 1102 විදේශීය | | 11 | - | - | 124,215 | 124,215 | 124,215 | - | 124,215 | - | - | |
| එකතුව (අ) | | | **12,000,000** | - | **124,215** | **12,124,215** | **11,171,104** | - | **11,171,104** | **953,111** | | |
| සැපයීම් | | | | | | | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 11 | 12,500,000 | - | 2,300,000 | 14,800,000 | 14,028,884 | - | 14,028,884 | 771,116 | 5 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව මූලික ඇස්තමේන්තුවෙන් ඉතුරුම් 6%ක් තබා ගැනීම. |
| 1202 ඉන්ධන | | 11 | 16,000,000 | - | - | 16,000,000 | 14,434,174 | - | 14,434,174 | 1,565,826 | 10 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ ඉන්ධන වියදම් පාලනය කිරීම. |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | | 11 | 2,100,000 | - | - | 2,100,000 | 1,771,856 | - | 1,771,856 | 328,144 | 16 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ ආහාර පාන වියදම් පාලනය කිරීම. |
| එකතුව (ආ) | | | **30,600,000** | - | **2,300,000** | **32,900,000** | **30,234,914** | - | **30,234,914** | **2,665,086** | | |

ඊසීජ්-2(ii)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වැය විෂයය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | වියදම: මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | ශුද්ධ බලපෑම: වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නඩත්තු වියදම් | | | | | | | | | | | | |
| 1301 වාහන | | 11 | 12,500,000 | - | - | 12,500,000 | 10,388,624 | - | 10,388,624 | 2,111,376 | 17 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ වාහන අලුත්වැඩියා වියදම් අඩු වීම. |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | | 11 | 3,800,000 | - | - | 3,800,000 | 3,132,914 | - | 3,132,914 | 667,086 | 18 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ නව යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම හේතුවෙන් අලුත්වැඩියා වියදම් අවම වීම. |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 12,000,000 | - | (2,924,215) | 9,075,785 | 8,052,309 | - | 8,052,309 | 1,023,476 | 11 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ වියදම් පාලනය කිරීම. |
| **එකතුව ( ඇ )** | | | **28,300,000** | - | **(2,924,215)** | **25,375,785** | **21,573,847** | - | **21,573,847** | **3,801,938** | | |
| සේවා | | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | | 11 | 2,000,000 | - | (370,000) | 1,630,000 | 1,352,221 | - | 1,352,221 | 277,779 | 17 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ වියදම් පාලනය කිරීම. |
| 1402 තැපැල් හා සන්නිවේදන | | 11 | 8,200,000 | - | - | 8,200,000 | 7,245,429 | - | 7,245,429 | 954,571 | 12 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ වියදම් පාලනය කිරීම. |
| 1403 විදුලිය හා ජලය | | 11 | 8,500,000 | - | 500,000 | 9,000,000 | 8,260,141 | - | 8,260,141 | 739,859 | 8 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ වියදම් පාලනය කිරීම. |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | | 11 | 1,000,000 | - | - | 1,000,000 | 801,471 | - | 801,471 | 198,529 | 20 | අපේක්ෂිත පරිදි වියදම් ජනිත නොවීම. |
| 1409 වෙනත් | | 11 | 24,000,000 | - | - | 24,000,000 | 22,515,366 | - | 22,515,366 | 1,484,634 | 6 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2023 අනුව ඉතුරුම් 6%ක් තබා ගැනීම සහ වියදම් පාලනය කිරීම. |
| **එකතුව ( ඇ )** | | | **43,700,000** | - | **130,000** | **43,830,000** | **40,174,628** | - | **40,174,628** | **3,655,372** | | |
| **අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)** | | | **114,600,000** | - | **(370,000)** | **114,230,000** | **103,154,492** | - | **103,154,492** | **11,075,508** | - | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර | 7 | | | | | | | | | | | |
| මාරුකිරීම් | | | | | | | | | | | | |
| 1504 සංවර්ධන සහනාධාර | | 11 | - | 10,806,000 | - | 10,806,000 | 10,331,673 | - | 10,331,673 | 474,327 | 4 | |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | | 11 | 2,400,000 | - | - | 2,400,000 | 1,815,934 | - | 1,815,934 | 584,066 | 24 | ස්ථාන මාරු වීම් නිසා වියදම් අවම වීම. |
| එකතුව | | | 2,400,000 | 10,806,000 | - | 13,206,000 | 12,147,607 | - | 12,147,607 | 1,058,393 | | |



ඊසීජ්-2(ii)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වැය විෂයය | සටහන | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | වියදම: මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | ශුද්ධ බලපෑම: වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද පොළී ගෙවීම් | 8 | | | | | | | | | | | |
| එකතුව | | | - | - | - | - | - | - | - | - | - | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් | 9 | | | | | | | | | | | |
| එකතුව | | | - | - | - | - | - | - | - | - | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| **මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)** | | | **692,000,000** | **10,806,000** | - | **702,806,000** | **632,522,469** | **972,325** | **633,494,794** | **69,311,206** | - | |
| මූලධන වියදම් | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය | | | | | | | | | | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | | | | | | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | 11 | 9,000,000 | - | - | 9,000,000 | 7,330,925 | - | 7,330,925 | 1,669,075 | 19 | වසරේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් අත්‍යාවශ්‍ය වහල අලුත්වැඩියා කටයුතු අවසන් කිරීමට නොහැකි වීම. |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | 11 | 800,000 | - | - | 800,000 | 676,300 | - | 676,300 | 123,700 | 15 | අපේක්ෂිත පරිදි වියදම් ජනිත නොවීම. |
| 2003 වාහන | | 11 | 4,000,000 | - | - | 4,000,000 | 2,823,743 | - | 2,823,743 | 1,176,257 | 29 | නව වාහන භාවිතා කිරීම හේතුවෙන් වියදම් අවම වීම |
| **එකතුව (අ)** | | | **13,800,000** | - | - | **13,800,000** | **10,830,968** | - | **10,830,968** | **2,969,032** | | |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | | | | | | | | | | | |
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | | 11 | 1,000,000 | - | - | 1,000,000 | 957,435 | - | 957,435 | 42,565 | 4 | |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | 11 | 1,000,000 | - | - | 1,000,000 | 974,547 | - | 974,547 | 25,453 | 3 | |
| **එකතුව (ආ)** | | | **3,000,000** | - | - | **3,000,000** | **2,931,982** | - | **2,931,982** | **68,018** | | |
| ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | | | | | | | | | | | |
| එකතුව ( ඇ ) | | | - | - | - | - | - | - | - | - | | |

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| වැය විෂයය | සටහන | මූලාශ්‍රයේ සංකේත අංකය | ප්‍රතිපාදනය | | | | වියදම | | | ශුද්ධ බලපෑම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
| <u>මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම</u> | 13 | | | | | | | | | | | |
| එකතුව (ඈ) | | | - | - | - | - | - | - | - | - | - | |
| <u>හැකියා වර්ධනය</u> | 14 | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | | 11 | 1,200,000 | - | - | 1,200,000 | 681,129 | - | 681,129 | 518,871 | 43 | ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2023 අනුව වියදම් පාලනය කිරීම. |
| එකතුව (ඉ ) | | | 1,200,000 | - | - | 1,200,000 | 681,129 | - | 681,129 | 518,871 | | |
| <u>වෙනත් මූලධන වියදම්</u> | 15 | | | | | | | | | | | |
| 2509 වෙනත් | | 11 | - | | | - | - | | - | - | - | |
| එකතුව (ඊ) | | | - | - | - | - | - | - | - | - | - | |
| <u>වැඩසටහන (I)</u> | | | | | | | | | | | | |
| රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ) | | | 18,000,000 | - | - | 18,000,000 | 14,444,079 | - | 14,444,079 | 3,555,921 | | |
| මුළු වියදම්වල එකතුව (සටහන 5-15) | | | 710,000,000 | 10,806,000 | - | 720,806,000 | 646,966,548 | 972,325 | 647,938,873 | 72,867,127 | | |

............................................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024 . 02 . 12

ජී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

ඒසීඒ- 2(iv)

## වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය
වියදම් ශීර්ෂ අංකය: 260

| | මූල්‍යකරණය | වැඩසටහන 01* | | වැඩසටහන 02* | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය ** 1 | සත්‍ය වියදම 2 | ශුද්ධ ප්‍රතිපාදනය ** 3 | සත්‍ය වියදම 4 | ශුද්ධ ප්‍රතිපාදනය ** 5 | සත්‍ය වියදම 6 | වියදමේ ප්‍රතිශතය *** (6÷5)X100 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | % |
| 11 | දේශීය අරමුදල් | 720,806,000 | 647,938,873 | | | 720,806,000 | 647,938,873 | 90 |
| 12 | විදේශ ණය | | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| 17 | විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය | | | | | | | |
| 18 | විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | |
| | එකතුව | **720,806,000** | **647,938,873** | **0** | **0** | **720,806,000** | **647,938,873** | |

.....................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.12

පී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.



ඒසීඒ- 2(v)

## එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය
(වැඩසටහනක ව්‍යාපෘති අනුව මූලධන වියදම් හා පුනරාවර්තන වියදම්වල මූල්‍යකරණය)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය
වියදම් ශීර්ෂ අංකය: 260
වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| | මූල්‍යකරණය | ව්‍යාපෘති 1 | | ව්‍යාපෘති 2 | | ව්‍යාපෘති 3 | | වැඩසටහනේ එකතුව/පිටුවේ එකතුව* | |
|---|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11 | දේශීය අරමුදල් | 146,789,184 | 127,226,836 | 574,016,816 | 520,712,037 | - | - | 720,806,000 | 647,938,873 |
| 12 | විදේශ ණය | | | | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | | |
| 17 | විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය | | | | | | | | |
| 18 | විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | | |
| | එකතුව | **146,789,184** | **127,226,836** | **574,016,816** | **520,712,037** | **-** | **-** | **720,806,000** | **647,938,873** |

.....................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.12

පී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

ඒසිඒ-3

## 2023 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය
වියදම් ශීර්ෂ අංකය: 260

රු.

| අග්‍රිම ගිණුම් අංකය | 2023 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1 | | | අග්‍රිම ලැබීම 2 | | | අග්‍රිම පියවීම 3 | | | 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4 | | | 2023 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය | 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොපිය වූ උප අග්‍රිම 1(i) | නොපිය වූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර) 1(ii) | එකතුව 1(iii) | භාණ්ඩාගාරයෙන් 2(i) | වෙනත් මූලාශ්‍රවලින් 2(ii) | එකතුව 2(iii)=2(i)+2(ii) | වියදම් මගින් 3(i) | මුදල් මගින් 3(ii) | එකතුව 3(iii)=3(i)+3(ii) | නොපිය වූ උප අග්‍රිම ශේෂය 4(i) | නොපිය වූ අග්‍රිම ශේෂය 4(ii) | එකතුව 4(iii)=4(i)+4(ii) | *5 5=1(iii)+2(iii)-3(iii) | 6 |
| 7002-0-0-307-0-21-0 | 900,878 | | 900,878 | | | - | | | - | 900,878 | | 900,878 | 900,878 | 900,878 |
| 7002-0-0-307-0-23-0 | | | | 2,656,491,085 | 309,367,924 | 2,965,859,009 | 2,951,351,853 | 14,507,157 | 2,965,859,009 | - | - | - | - | - |
| | 900,878 | - | 900,878 | 2,656,491,085 | 309,367,924 | 2,965,859,009 | 2,951,351,853 | 14,507,157 | 2,965,859,009 | 900,878 | - | 900,878 | 900,878 | 900,878 |

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න
   (1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2023.12.31 දිනට මුදල් ශේෂය - -
   (2) වෙනත් හේතු - .................................................. - -

-

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

2012 වර් ෂ යේදී කොන්ත්‍රාත් සඳහා ලබා දුන් වැඩ ආරම්භ කිරී මේ අත්තිකාරම් මුදල නොපියවීම

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.12

පී. ඒ. ඩී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.



ඒසිඒ -4

## 2023 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 260

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

රු.

| තැන්පතු ගිණුමේ නම | තැන්පතු අංකය | 2023 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය තුළ බැර කිරීම් | වර්ෂය තුළ හර කිරීම් | 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඇප තැන්පත් | 6000-0-0-1-0-47 | 100,000 | 546,320 | 205,320 | 441,000 | 441,000 |
| ටෙන්ඩර් තැන්පත් | 6000-0-0-2-0-63 | 2,000 | 336,974 | 236,973 | 102,001 | 102,001 |
| කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් | 6000-0-0-16-0-16 | 32,511,394 | 5,907,155 | 29,167,791 | 9,250,757 | 9,250,757 |
| වන්දි ගෙවීම | 6000-0-0-17-33 | 143,200,228 | 52,140,796 | 66,060,704 | 129,280,320 | 129,280,320 |
| ව්‍යවස්ථාපිත ගෙවීම වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම | 6000-0-0-18-0-19 | 33,797,173 | 135,941,610 | 143,382,373 | 26,356,410 | 26,356,410 |
| | | 209,610,795 | 194,872,854 | 239,053,161 | 165,430,488 | 165,430,488 |

..........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.12

පී. ඒ. ඩී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

ඇමුණුම - (viii)

**2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ**

**2023.12.31 දිනට තත්ත්ව වාර්තාව**

විෂයදම් ශීර්ෂ අංකය: 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2023.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | 2023.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය | 2023.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| | | | (රු.) | (රු.) | | |
| | | | | | | |
| 1 | ලංකා බැංකුව -තැප්‍රෝබේන් ශාඛාව | 7041817 | 2,728,343.49 | | | දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව - නුවරඑළිය ශාඛාව | 7041818 | 21,924,655.09 | | | දෙසැම්බර් |
| 3 | ලංකා බැංකුව - නුවරඑළිය ශාඛාව | 7041820 | 144,119,445.38 | | | දෙසැම්බර් |
| 4 | මහජන බැංකුව - ගිනිගත්හේන ශාඛාව | 9026765 | 190,064,067.91 | | | දෙසැම්බර් |
| 5 | මහජන බැංකුව - පූඩලූඔය ශාඛාව | 9026771 | 23,468,166.22 | | | දෙසැම්බර් |
| 6 | මහජන බැංකුව - නිල්දන්ඩාහින්න ශාඛාව | 9026766 | 40,147,051.82 | | | දෙසැම්බර් |
| 7 | මහජන බැංකුව - හඟුරන්කෙත ශාඛාව | 0029401 | 11,820,639.96 | | | දෙසැම්බර් |
| | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.......................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024.02.12

පී. ඒ. ඩී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

43

ඇමුණුම - (iii)

## දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

| ස්වභාවය | බැඳීම් අංකය | දිනය | පුද්ගලයාගේ/ආයතනයේ නම | වැය විෂය | බැඳීම් (රු) | බැඳීම් ශේෂය (රු) | බැරකම්වලට ඇතුලත් වූ දිනය | බැරකම් වටිනාකම (රු) | සංශෝධිත බැරකම් (රු) | බැරකම් නිදහස් කිරීම (රු) | බැරකම් ශේෂය (රු) | වාර් තා කරන ආයතනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රාජ්‍ය | 870*1 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි | WAL-260-1-2-0-1101-P | 276,601.80 | 0 | 2023 දෙසැම්බර් 31 | 276,601.80 | 0 | 0 | 276,601.80 | 260 |
| සංස්ථා | 870*10 | 2023 දෙසැම්බර් 31 | ජාතික ජල හා ජලාපවාහන මණ්ඩලය | WAL-260-1-2-0-1403-P | 13,709.57 | 0 | 2023 දෙසැම්බර් 31 | 13,709.57 | 0 | 0 | 13,709.57 | 260 |
| රාජ්‍ය | 870*11 | 2023 දෙසැම්බර් 31 | තැපැල් අධිකාරි | WAL-260-1-2-0-1402-P | 2,580.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 2,580.00 | 0 | 0 | 2,580.00 | 260 |
| රාජ්‍ය | 870*13 | 2023 දෙසැම්බර් 31 | එම්.ජී.ඉන්දික කුමාර | WAL-260-1-2-0-1203-P | 3,388.32 | 0 | 2023 දෙසැම්බර් 31 | 3,388.32 | 0 | 0 | 3,388.32 | 260 |
| සංස්ථා | 870*14 | 2023 දෙසැම්බර් 31 | ලංකා විදුලිබල මණ්ඩලය | WAL-260-1-2-0-1403-P | 22,216.38 | 0 | 2023 දෙසැම්බර් 31 | 22,216.38 | 0 | 0 | 22,216.38 | 260 |
| රාජ්‍ය | 870*15 | 2023 දෙසැම්බර් 31 | කේ.ජී.අයි.සුරංග | WAL-260-1-2-0-1101-P | 10,464.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 10,464.00 | 0 | 0 | 10,464.00 | 260 |
| සංස්ථා | 870*16 | 2023 දෙසැම්බර් 31 | ශ්‍රී ලංකා ටෙලිකොම් | WAL-260-1-2-0-1402-P | 4,102.46 | 0 | 2023 දෙසැම්බර් 31 | 4,102.46 | 0 | 0 | 4,102.46 | 260 |
| පෞද්ගලික | 870*2 | 2023 දෙසැම්බර් 31 | ස්ටාර්ලයින් ආරක්ෂක සේවාය | WAL-260-1-2-0-1409-P | 50,740.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 50,740.00 | 0 | 0 | 50,740.00 | 260 |
| පෞද්ගලික | 870*3 | 2023 දෙසැම්බර් 31 | ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් ප්‍රයිවට් ලිමිටඩ් | WAL-260-1-2-0-1409-P | 17,710.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 17,710.00 | 0 | 0 | 17,710.00 | 260 |
| රාජ්‍ය | 870*4 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | WAL-260-1-2-0-1101-P | 80,348.90 | 0 | 2023 දෙසැම්බර් 31 | 80,348.90 | 0 | 0 | 80,348.90 | 260 |
| රාජ්‍ය | 870*8 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | WAL-260-1-2-0-1002-P | 38,896.38 | 0 | 2023 දෙසැම්බර් 31 | 38,896.38 | 0 | 0 | 38,896.38 | 260 |
| රාජ්‍ය | P10 | 2023 දෙසැම්බර් 31 | සරජ් - ප්‍රාදේශිය ලේකම් කාර් යාලය හඟුරන්කෙත | HAN-260-1-2-0-1101-P | 553,252.12 | 0 | 2023 දෙසැම්බර් 31 | 553,252.12 | 0 | 0 | 553,252.12 | 260 |
| රාජ්‍ය | P12 | 2023 දෙසැම්බර් 31 | සරජ් - ප්‍රාදේශිය ලේකම් කාර් යාලය හඟුරන්කෙත | HAN-260-1-2-0-1002-P | 75,581.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 75,581.00 | 0 | 0 | 75,581.00 | 260 |
| රාජ්‍ය | 1 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - දෙසැම්බර් | KOT-260-1-2-0-1101-P | 5,320.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 5,320.00 | 0 | 0 | 5,320.00 | 260 |
| රාජ්‍ය | 2 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - ඔක්තෝබර් | KOT-260-1-2-0-1101-P | 3,569.20 | 0 | 2023 දෙසැම්බර් 31 | 3,569.20 | 0 | 0 | 3,569.20 | 260 |
| රාජ්‍ය | 3 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 4,132.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 4,132.00 | 0 | 0 | 4,132.00 | 260 |
| රාජ්‍ය | 4 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 20,878.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 20,878.00 | 0 | 0 | 20,878.00 | 260 |
| රාජ්‍ය | 5 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 27,538.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 27,538.00 | 0 | 0 | 27,538.00 | 260 |
| රාජ්‍ය | 6 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - ඔක්තෝබර් | KOT-260-1-2-0-1101-P | 9,763.48 | 0 | 2023 දෙසැම්බර් 31 | 9,763.48 | 0 | 0 | 9,763.48 | 260 |
| රාජ්‍ය | 7 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - දෙසැම්බර් | KOT-260-1-2-0-1101-P | 59,996.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 59,996.00 | 0 | 0 | 59,996.00 | 260 |
| රාජ්‍ය | 8 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 56,284.20 | 0 | 2023 දෙසැම්බර් 31 | 56,284.20 | 0 | 0 | 56,284.20 | 260 |
| රාජ්‍ය | 9 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - අගෝස්තු | KOT-260-1-2-0-1101-P | 4,238.82 | 0 | 2023 දෙසැම්බර් 31 | 4,238.82 | 0 | 0 | 4,238.82 | 260 |
| රාජ්‍ය | 10 | 2023 දෙසැම්බර් 31 | නදීරා | KOT-260-1-2-0-1202-P | 11,232.06 | 0 | 2023 දෙසැම්බර් 31 | 11,232.06 | 0 | 0 | 11,232.06 | 260 |
| රාජ්‍ය | 11 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | KOT-260-1-2-0-1002-P | 56,611.26 | 0 | 2023 දෙසැම්බර් 31 | 56,611.26 | 0 | 0 | 56,611.26 | 260 |
| රාජ්‍ය | 12 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | KOT-260-1-2-0-1002-P | 63,475.82 | 0 | 2023 දෙසැම්බර් 31 | 63,475.82 | 0 | 0 | 63,475.82 | 260 |
| රාජ්‍ය | 13 | 2023 දෙසැම්බර් 31 | ජයතිලක | KOT-260-1-2-0-1101-P | 884 | 0 | 2023 දෙසැම්බර් 31 | 884 | 0 | 0 | 884 | 260 |
| රාජ්‍ය | 14 | 2023 දෙසැම්බර් 31 | ජයතිලක - මැයි | KOT-260-1-2-0-1101-P | 2,635.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 2,635.00 | 0 | 0 | 2,635.00 | 260 |
| රාජ්‍ය | 15 | 2023 දෙසැම්බර් 31 | වර් ණවීර - සැප්තැම්බර් | KOT-260-1-2-0-1101-P | 2,761.20 | 0 | 2023 දෙසැම්බර් 31 | 2,761.20 | 0 | 0 | 2,761.20 | 260 |
| රාජ්‍ය | 16 | 2023 දෙසැම්බර් 31 | ප්‍රදීප් - අප්‍රේල් | KOT-260-1-2-0-1101-P | 1,337.60 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,337.60 | 0 | 0 | 1,337.60 | 260 |
| රාජ්‍ය | 17 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | KOT-260-1-2-0-1002-P | 49,960.75 | 0 | 2023 දෙසැම්බර් 31 | 49,960.75 | 0 | 0 | 49,960.75 | 260 |
| රාජ්‍ය | 18 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | KOT-260-1-2-0-1002-P | 1,081.66 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,081.66 | 0 | 0 | 1,081.66 | 260 |
| රාජ්‍ය | 19 | 2023 දෙසැම්බර් 31 | නිමල් | KOT-260-1-2-0-1002-P | 2,143.20 | 0 | 2023 දෙසැම්බර් 31 | 2,143.20 | 0 | 0 | 2,143.20 | 260 |
| රාජ්‍ය | 20 | 2023 දෙසැම්බර් 31 | සිසිරංග | KOT-260-1-2-0-1002-P | 16,975.84 | 0 | 2023 දෙසැම්බර් 31 | 16,975.84 | 0 | 0 | 16,975.84 | 260 |
| රාජ්‍ය | 21 | 2023 දෙසැම්බර් 31 | නිමල් - නොවැම්බර් | KOT-260-1-2-0-1002-P | 34,282.62 | 0 | 2023 දෙසැම්බර් 31 | 34,282.62 | 0 | 0 | 34,282.62 | 260 |
| පෞද්ගලික | 22 | 2023 දෙසැම්බර් 31 | රනාරෝ ආරක්ෂක පුද්ගලික සමාගම | KOT-260-1-2-0-1409-P | 36,006.50 | 0 | 2023 දෙසැම්බර් 31 | 36,006.50 | 0 | 0 | 36,006.50 | 260 |
| පෞද්ගලික | 23 | 2023 දෙසැම්බර් 31 | සුපර් ක්ලිනින්ග් ඇන්ඩ් ජනිටෝරියල් | KOT-260-1-2-0-1409-P | 67,154.39 | 0 | 2023 දෙසැම්බර් 31 | 67,154.39 | 0 | 0 | 67,154.39 | 260 |
| සංස්ථා | 24 | 2023 දෙසැම්බර් 31 | මහජන බැංකුව - ලංකා විදුලිබල මණ්ඩලය | KOT-260-1-2-0-1403-P | 20,574.36 | 0 | 2023 දෙසැම්බර් 31 | 20,574.36 | 0 | 0 | 20,574.36 | 260 |
| රාජ්‍ය | 25 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - ජනවාරි | KOT-260-1-2-0-1101-P | 600 | 0 | 2023 දෙසැම්බර් 31 | 600 | 0 | 0 | 600 | 260 |
| රාජ්‍ය | 26 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - පෙබරවාරි | KOT-260-1-2-0-1101-P | 600 | 0 | 2023 දෙසැම්බර් 31 | 600 | 0 | 0 | 600 | 260 |
| රාජ්‍ය | 27 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - අප්‍රේල් | KOT-260-1-2-0-1101-P | 600 | 0 | 2023 දෙසැම්බර් 31 | 600 | 0 | 0 | 600 | 260 |



ඇමුණුම - (iii)

## දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

| ස්වභාවය | බැඳීම් අංකය | දිනය | පුද්ගලයාගේ/ආයතනයේ නම | වැය විෂය | බැඳීම් (රු) | බැඳීම් ශේෂය (රු) | බැරකම්වලට ඇතුලත් වූ දිනය | බැරකම් වටිනාකම (රු) | සංශෝධිත බැරකම් (රු) | බැරකම් නිදහස් කිරීම (රු) | බැරකම් ශේෂය (රු) | වාර් තා කරන ආයතනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රාජ්‍ය | 28 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - මාර්තු | KOT-260-1-2-0-1101-P | 1,200.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,200.00 | 0 | 0 | 1,200.00 | 260 |
| රාජ්‍ය | 29 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - මැයි | KOT-260-1-2-0-1101-P | 1,800.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,800.00 | 0 | 0 | 1,800.00 | 260 |
| රාජ්‍ය | 30 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - ජූනි | KOT-260-1-2-0-1101-P | 1,200.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,200.00 | 0 | 0 | 1,200.00 | 260 |
| රාජ්‍ය | 31 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - ජූලි | KOT-260-1-2-0-1101-P | 1,800.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,800.00 | 0 | 0 | 1,800.00 | 260 |
| රාජ්‍ය | 32 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - සැප්තැම්බර් | KOT-260-1-2-0-1101-P | 7,200.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 7,200.00 | 0 | 0 | 7,200.00 | 260 |
| රාජ්‍ය | 33 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - අගෝස්තු | KOT-260-1-2-0-1101-P | 3,000.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 3,000.00 | 0 | 0 | 3,000.00 | 260 |
| රාජ්‍ය | 34 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - ඔක්තෝබර් | KOT-260-1-2-0-1101-P | 27,600.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 27,600.00 | 0 | 0 | 27,600.00 | 260 |
| රාජ්‍ය | 35 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 40,800.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 40,800.00 | 0 | 0 | 40,800.00 | 260 |
| රාජ්‍ය | 36 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි - දෙසැම්බර් | KOT-260-1-2-0-1101-P | 39,000.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 39,000.00 | 0 | 0 | 39,000.00 | 260 |
| රාජ්‍ය | 37 | 2023 දෙසැම්බර් 31 | අංජනා - දෙසැම්බර් | KOT-260-1-2-0-1101-P | 9,100.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 9,100.00 | 0 | 0 | 9,100.00 | 260 |
| රාජ්‍ය | 38 | 2023 දෙසැම්බර් 31 | ජයසිරි - දෙසැම්බර් | KOT-260-1-2-0-1101-P | 1,000.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,000.00 | 0 | 0 | 1,000.00 | 260 |
| රාජ්‍ය | 39 | 2023 දෙසැම්බර් 31 | ජයසිරි සහ වෙනත් - දෙසැම්බර් | KOT-260-1-2-0-1002-P | 21,786.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 21,786.00 | 0 | 0 | 21,786.00 | 260 |
| සංස්ථා | 40 | 2023 දෙසැම්බර් 31 | ශ්‍රී ලංකා ටෙලිකොම් | KOT-260-1-2-0-1402-P | 5,661.68 | 0 | 2023 දෙසැම්බර් 31 | 5,661.68 | 0 | 0 | 5,661.68 | 260 |
| රාජ්‍ය | 41 | 2023 දෙසැම්බර් 31 | ග්‍රාම නිලධාරි | KOT-260-1-2-0-1101-P | 872 | 0 | 2023 දෙසැම්බර් 31 | 872 | 0 | 0 | 872 | 260 |
| රාජ්‍ය | 42 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය-නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 8,410.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 8,410.00 | 0 | 0 | 8,410.00 | 260 |
| රාජ්‍ය | 43 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය-නොවැම්බර් | KOT-260-1-2-0-1101-P | 1,455.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,455.00 | 0 | 0 | 1,455.00 | 260 |
| රාජ්‍ය | 44 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය-දෙසැම්බර් | KOT-260-1-2-0-1101-P | 10,000.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 10,000.00 | 0 | 0 | 10,000.00 | 260 |
| රාජ්‍ය | 45 | 2023 දෙසැම්බර් 31 | අංජනා | KOT-260-1-2-0-1002-P | 11,195.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 11,195.00 | 0 | 0 | 11,195.00 | 260 |
| සංස්ථා | 46 | 2023 දෙසැම්බර් 31 | මහජන බැංකුව - ලංකා විදුලිබල මණ්ඩලය | KOT-260-1-2-0-1403-P | 3,346.67 | 0 | 2023 දෙසැම්බර් 31 | 3,346.67 | 0 | 0 | 3,346.67 | 260 |
| සංස්ථා | P2312/01 | 2023 දෙසැම්බර් 31 | ශ්‍රී ලංකා ටෙලිකොම් | NUW-260-1-2-0-1402-P | 21,171.62 | 0 | 2023 දෙසැම්බර් 31 | 21,171.62 | 0 | 0 | 21,171.62 | 260 |
| පෞද්ගලික | P2312/02 | 2023 දෙසැම්බර් 31 | මොබිටෙල් ප්‍රයිවට් ලිමිටඩ් | NUW-260-1-2-0-1402-P | 1,863.10 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,863.10 | 0 | 0 | 1,863.10 | 260 |
| සංස්ථා | P2312/03 | 2023 දෙසැම්බර් 31 | ශ්‍රී ලංකා ටෙලිකොම් | NUW-260-1-2-0-1402-P | 1,708.47 | 0 | 2023 දෙසැම්බර් 31 | 1,708.47 | 0 | 0 | 1,708.47 | 260 |
| පෞද්ගලික | P2312/04 | 2023 දෙසැම්බර් 31 | රිනෝෂාන් ක්ලීනින්ග් සර් විස් | NUW-260-1-2-0-1409-P | 56,480.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 56,480.00 | 0 | 0 | 56,480.00 | 260 |
| පෞද්ගලික | P2312/05 | 2023 දෙසැම්බර් 31 | රනාරෝ ආරක්ෂක පුද්ගලික සමාගම | NUW-260-1-2-0-1409-P | 72,013.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 72,013.00 | 0 | 0 | 72,013.00 | 260 |
| රාජ්‍ය | P2312/06 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | NUW-260-1-2-0-1002-P | 114,506.56 | 0 | 2023 දෙසැම්බර් 31 | 114,506.56 | 0 | 0 | 114,506.56 | 260 |
| සංස්ථා | P2312/07 | 2023 දෙසැම්බර් 31 | ආදායම් ගිණුම - ලංකා විදුලිබල මණ්ඩලය | NUW-260-1-2-0-1403-P | 114,566.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 114,566.00 | 0 | 0 | 114,566.00 | 260 |
| පෞද්ගලික | P2312/08 | 2023 දෙසැම්බර් 31 | කරුණාපාල ඩීසල් මෝටර්ස් | NUW-260-1-2-0-1301-P | 84,900.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 84,900.00 | 0 | 0 | 84,900.00 | 260 |
| පෞද්ගලික | P2312/09 | 2023 දෙසැම්බර් 31 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජිස් ප්‍රයිවට් ලිමිටඩ් | NUW-260-1-2-0-1302-P | 84,894.84 | 0 | 2023 දෙසැම්බර් 31 | 84,894.84 | 0 | 0 | 84,894.84 | 260 |
| රාජ්‍ය | P2312/10 | 2023 දෙසැම්බර් 31 | තැපැල් අධිකාරි 003-1001-29027336 | NUW-260-1-2-0-1402-P | 20,000.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 20,000.00 | 0 | 0 | 20,000.00 | 260 |
| පෞද්ගලික | P2312/11 | 2023 දෙසැම්බර් 31 | රිනෝෂාන් ක්ලීනින්ග් සර් විස් | NUW-260-1-2-0-1409-P | 23,425.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 23,425.00 | 0 | 0 | 23,425.00 | 260 |
| පෞද්ගලික | P2312/12 | 2023 දෙසැම්බර් 31 | රනාරෝ ආරක්ෂක පුද්ගලික සමාගම | NUW-260-1-2-0-1409-P | 72,013.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 72,013.00 | 0 | 0 | 72,013.00 | 260 |
| රාජ්‍ය | P2312/13 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | NUW-260-1-2-0-1002-P | 192,583.32 | 0 | 2023 දෙසැම්බර් 31 | 192,583.32 | 0 | 0 | 192,583.32 | 260 |
| සංස්ථා | P2312/14 | 2023 දෙසැම්බර් 31 | ජාතික ජල හා ජලාපවාහන මණ්ඩලය | NUW-260-1-2-0-1403-P | 6,874.69 | 0 | 2023 දෙසැම්බර් 31 | 6,874.69 | 0 | 0 | 6,874.69 | 260 |
| රාජ්‍ය | P2312/15 | 2023 දෙසැම්බර් 31 | කාර් යාල කාර් ය මණ්ඩලය | NUW-260-1-2-0-1101-P | 3,051.00 | 0 | 2023 දෙසැම්බර් 31 | 3,051.00 | 0 | 0 | 3,051.00 | 260 |
| රාජ්‍ය | 1-Jan | 2023 දෙසැම්බර් 31 | සරජ් - ප්‍රාදේශිය ලේකම් කාර් යාලය ගිනිහත්හේන | AMB-260-1-2-0-1101-P | 291,207.40 | 0 | 2023 දෙසැම්බර් 31 | 291,207.40 | 0 | 0 | 291,207.40 | 260 |
| රාජ්‍ය | 2-Jan | 2023 දෙසැම්බර් 31 | සරජ් - ප්‍රාදේශිය ලේකම් කාර් යාලය ගිනිහත්හේන | AMB-260-1-2-0-1002-P | 10,583.75 | 0 | 2023 දෙසැම්බර් 31 | 10,583.75 | 0 | 0 | 10,583.75 | 260 |
| රාජ්‍ය | 3-Jan | 2023 දෙසැම්බර් 31 | සරජ් - ප්‍රාදේශිය ලේකම් කාර් යාලය ගිනිහත්හේන | AMB-260-1-2-0-1003-P | 11,903.75 | 0 | 2023 දෙසැම්බර් 31 | 11,903.75 | 0 | 0 | 11,903.75 | 260 |
| සංස්ථා | 4-Jan | 2023 දෙසැම්බර් 31 | මහජන බැංකුව - ලංකා විදුලිබල මණ්ඩලය | AMB-260-1-2-0-1403-P | 97,406.65 | 0 | 2023 දෙසැම්බර් 31 | 97,406.65 | 0 | 0 | 97,406.65 | 260 |

ඇමුණුම -(ii)

## පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: : 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | | |
| (ii) | රු. 25,000.01 වැඩි | 1 | 26,750 |
| | එකතුව | **1** | **26,750** |

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

| | අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය | අලාභයේ වටිනාකම | අයකර ගැනීම | පොතෙන් කපා හල අගය | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | CPPA - 4901 වාහන අනතුර | 278,191 | | 60,000 | | 218,191 | |
| 2 | CPKB - 0954 වාහන අනතුර | 5,000 | | 5,000 | | - | GANE/AD/03/04/22 |
| 3 | WPPA - 4901 වාහන අනතුර | 30,000 | | 30,000 | | - | GANE/AD/03/04/25 |
| 4 | 300-5010 වාහන අනතුර | | 26,750 | 26,750 | | | GANE/AD/03/04/26 |
| | එකතුව | **313,191** | **26,750** | **121,750** | **-** | **218,191** | |

...............................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024 ·02·12

පී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

38

ඇමුණුම - (i)

## පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
## (මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: : 260 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : නුවරඑළිය

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් ක්‍රියාකාරකම්

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/කපාහැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| අඩු | Rs. 25,000.00 | 1 | 5,000 |
| වැඩි | Rs. 25,000.01 | 3 | 116,750 |
| | එකතුව | 4 | **121,750** |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| CPPA - 4901 වාහන අනතුර | 1 | 60,000 |
| CPKB - 0954 වාහන අනතුර | 1 | 5,000 |
| WPPA - 4901 වාහන අනතුර | 1 | 30,000 |
| 300-5010 වාහන අනතුර | 1 | 26,750 |
| එකතුව | **4** | **121,750** |

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

| | අගය | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| අඩු | Rs. 25,000.00 | | |
| වැඩි | Rs. 25,000.01 | 1 | 218,191 |
| | | **1** | **218,191** |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 . CPPA - 4901 වාහන අනතුර | 1 | 218,191 |
| එකතුව | **1** | **218,191** |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | 1 |
| | ගණන | 218,191 |

...............................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024 ·02·12

පී. ඒ. බී. දමයන්ති
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
නුවරඑළිය.

37

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර් ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 692,000,000 | 702,806,000 | 663,494,794 | 95.8% |
| ප්‍රාග්ධන | 18,000,000 | - | 14,444,079 | 80.2% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර් තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර් තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර් තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,218,204,156.83 | 1,218,204,156.83 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 382,891,292.15 | 382,891,292.15 | - | 100% |
| 9153 | ඉඩම් | 1,067,278,000.00 | 1,067,278,000.00 | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 5,044,166.32 | 5,044,166.32 | - | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9 විගණන වාර්තාව

මගේ අංකය / எனது இல. / My No. CPCG/NE/A/KCH/2023/20 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 14 දින.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
17 MAY 2024
නුවරඑළිය

දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

නුවරඑළිය.

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.ආනන්ද,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත:- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය,කොළඹ - 01.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CPCG/NE/A/KCH/2023/20

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 14 දින

ගණන්දීමේ නිලධාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

**ශීර්ෂය 260 නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 260 නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 14 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 | ආදායම හා වියදම ගිණුම්ගත කල යුතුය | 1.6.2 |
| 1.6.3 | නොපියවූ අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය | 1.6.5 |
| 3.1.2 (ආ) | ප්‍රතිපාදන ලබාගෙන විධිමත් අධීක්ෂණයක් තුලින් වැඩ නිම කර ගැනීමට කටයුතු කල යුතුය | 3.1.2 (ඈ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2018 මැයි 10 දිනැති අංක 265/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය පරිදි රාජ්‍ය අංශයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කල යුතු බව දක්වා වසර 05 ක කාලයක් ගතවී තිබුණද, සමාලෝචිත වර්ෂය වන විටත් එම ප්‍රමිතීන් අනුගමනය කර නොතිබුණි.

### 1.6.2 පුනරාවර්තන වියදම්

හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සූර්ය විදුලි බල පද්ධතියෙන් සමාලෝචිත වර්ෂයේ ජාතික පද්ධතියට විදුලිය ඒකක 4603 ක් ලබාදී තිබුණු අතර, පරිභෝජනය කල ඒකක ප්‍රමාණය 8443 ක් විය. විදුලිය වියදම් ගිණුම් ගත කිරීමේදී පරිභෝජනය කල ප්‍රමාණය නිෂ්පාදනය කළ ප්‍රමාණයට හිලව් කර රු.196,119 ක බිල්පත් පියවීම හේතුවෙන් විදුලි ඒකක 4603 ට අදාල මුළු ආදායම හා ඒකක 8443 ට අදාළ මුළු වියදම ගිණුම් ගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

**1.6.3 මූල්‍ය නොවන වත්කම්**

(අ) විෂයයන් 03 කට අයත් වත්කම්වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය සැසදීමේදී රු.15,939,304 ක වෙනසක් පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබුණු ශේෂ පිරික්සුම අනුව, වාසස්ථාන හා නේවාසික නොවන ගොඩනැගිලි (9151) සහ ප්‍රවාහන උපකරණ හා වෙනත් යන්ත්‍රෝපකරණ උපකරණ (9152) වර්ෂයේ එකතුකිරීම්වල එකතුව රු.148,443,315 ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල (SA82) වර්ෂය තුල එකතුකිරීම්වල එකතුව රු.114,577,953 ක් ලෙස දක්වා තිබීමෙන් රු.33,865,362 ක වෙනසක් පැවතුණි.එමෙන්ම වාසස්ථාන හා නේවාසික නොවන ගොඩනැගිලි (9151) ශේෂයේ වර්ෂයේ ඉවත්කිරීම්,ශේෂ පිරික්සුම අනුව රු.31,246,266 ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල (SA82) රු.10,593,800 ක් ලෙස දක්වා තිබීමෙන් රු.20,652,466 ක වෙනසක් පැවතුණි.

**1.6.4 අවසාන තොගය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගයේ එකතුව රු.14,464,074 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.6.5 අග්‍රිම ගිණුමේ ශේෂය**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට පිළියෙල කල මූල්‍ය ප්‍රකාශනයේ අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA-3) දක්වා තිබුණු, 2013 වර්ෂයේ සිට පැවත එන රු.900,878 ක අග්‍රිම ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම**

(අ) 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ප්‍රකාරව මු.රෙ.94(2) සහ 94 (3) යටතේ එළඹෙන ලද බැදීම් සහ වගකීම් විෂයන් 03කට අදාල රු 1,293,002 ක් මූල්‍ය ප්‍රකාශනයේ ආකෘතිපත්‍ර (iv) මගින් හෙළිදරව් කල යුතු වුවත් එසේ කිරීමකින් තොරව වර්ෂයට අදාල සියලු බැදීම් හා වගකීම් ආකෘතිපත්‍ර (iii) හි දක්වා තිබුණි.

(ආ) මු.රෙ.94 ට අනුව වාර්ෂික අනුමත ඇස්තුමේන්තු ඉක්මවා බැරකම් වලට එළඹිය නොහැකි බව දක්වා තිබුණද වැය විෂයන් දෙකකට අදාලව රු.1,148,175 ක් වාර්ෂික ඇස්තමේන්තු ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි.

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හල්ගොල්ල ග්‍රාම සේවා වසමේ අවධානම් තත්ත්වයක් හේතුවෙන් පදිංචිය ඉවත්කර ආපදා සහන සේවා ඒකකය විසින් රු.1,200,000 ක මුදලක් ලබාදී නව නිවසක් ඉදිකර එහි පුද්ගලයෙකු පදිංචි කරවා තිබුණද අවධානම් කලාපයේ පිහිටි පැරණි නිවස කඩා ඉවත් නොකිරීම හේතුවෙන් අදාල පදිංචිකරු නිවාස දෙකම පරිහරණය කරන බවක් නිරීක්ෂණය විය.

(ආ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යෑම් හා අධි අවධානම් තත්ත්වයන් හේතුවෙන් මුල් පදිංචි ස්ථානයෙන් ඉවත් කල පවුල් 03 ක පුද්ගලයන් සඳහා රු.3,300,000 ක් ලබා දී බෝපත්තලාව, ජයලත්පුර ප්‍රදේශයේ නිවාස ඉදිකර තිබුණි. ඉදිකිරීම් සඳහා යෝජිත භූමිය බෑවුම් සහිත නාය යෑමේ මධ්‍ය අවදානමක් සහිත භූමි ප්‍රදේශයක් බැවින්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශය අනුව "වැසි ජලය සහ නිවෙස්වල අප ජලය (Waste Water) පහලට ගලා යෑම සඳහා ක්‍රමවත්ව ආස්තරණය කරන ලද කොන්ක්‍රිට් කාණු පද්ධතියක් සකස් කල යුතු බවත්, ඉඩම් කට්ටි බෙදා දීමට පෙර කාණු පද්ධතිය සකස් කල යුතු බවටත්, නිර්දේශ කර තිබුණද, මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමකින් තොරව පුද්ගලයින් පදිංචි කර තිබුණි.

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහා කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | XXIV පරිච්ඡේදයේ 4.4 | 334,470 | මිය ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු ණය මුදල් අවුරුදු 01 ත් 03 ත් අතර කාලයක සිට අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මු.රෙ.326 | 9,425,000 | 2023 නොවැම්බර් 29 දින දක්වා අවස්ථා 06 කදී විධිමත් ආරක්ෂක ක්‍රියාමාර්ග නොමැතිව කිලෝ මීටර් 24 ක පමණ දුර ප්‍රමාණයක පිහිටි තලවාකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ප්‍රාදේශීය ලේකම් හා ගණකාධිකාරි විසින් මුදල් රැගෙන ගොස් තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 384(2) හා 386(6) | 20,175,000 | මාණ්ඩලික නිලධාරියකුගේ විශේෂ අනුමැතියක් නොමැතිව අවස්ථා 07 කදී රේඛනය අවලංගු කර විවෘත චෙක්පත් නිකුත් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 1645 (ආ) හා 1646 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වාහන 06 ක සමාලෝචිත වර්ෂයට අදාල මාසික සාරාංශ ඉදිරිපත්කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 3.2.5 ඡේදය | | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 හා 2022 වර්ෂයන්හි භාණ්ඩ සමීක්ෂණයට අදාලව භාණ්ඩ වර්ග 41 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ii) | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන චක්‍රලේඛ | 842,329 | සේවය අතහැර ගිය හා වැඩ තහනම් කල නිලධාරීන් 07 දෙනෙකුගේ ණය ශේෂ අයකර නොතිබුණි. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) විසින් 2021 දෙසැම්බර් 30 දින සිට 2023 ජූලි 30 දක්වා කාලය තුල පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇගිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. |
| (ii) | 2022 ජූනි 22 දිනැති අංක 14/2022 | 19,919 | ජ්‍යෙෂ්ඨත්වයට බාධාවක් නොවන අයුරින් වසර 05 ක කාල සීමාවක් සඳහා දේශීය නිවාඩු ලබාගත් අඹගමුව හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දෙදෙනෙකුගෙන් මාස 05 ත් මාස 10 ත් අතර කාලයට අදාල වැන්දඹු හා අනත්දරු භාරකාර අරමුදලට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

(අ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියෙකු නිවාඩු දැනුම් දීමකින් තොරව දින27 ක් සේවයට වාර්ථා කර නොතිබුණි.එසේම ආයතන ප්‍රධානියා හෝ අධීක්ෂණ නිලධාරියා දැනුවත් කිරීමකින් තොරව මහජන දිනය තුල රාජකාරියට වාර්තා නොකිරීම, ක්ෂේත්‍ර රාජකාරි සඳහා කල වැඩසටහන් හා ඉදිරි වැඩසටහන් ඉදිරිපත් නොකිරීම, දීර්ඝ කාලයක සිට සිදුකරමින් තිබියදී , සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අධීක්ෂණ නිලධාරීන් විසින් කිසිඳු විධිමත් පරීක්ෂණයක් සිදුකර විනය ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.581,160 ක වැටුප් ගෙවා තිබුණි.

(ආ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගලහාකැලේ රජයේ ඉඩමෙන් 2020 මාර්තු 27 සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 15 දක්වා ලද රු.82,030 ක ආදායම රාජ්‍ය ආදායමට බැර නොකර ඉන් රු.76,830 ක් විවිධ කටයුතු සඳහා වැයකර තිබුණි.

## 2.5 තැන්පතු

මුදල් රෙගුලාසි 570 (අ) ප්‍රකාරව ඉඩම් ඉල්ලීම් සඳහා තැන්පතු, තැන්පත් කල දින සිට වර්ෂ 10 ක් ඉක්මවූ විට මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කල යුතු වුවත්, 2011 වර්ෂයේ සිට 2013 අතර කාලය තුල අවස්ථා 07 කදි තැන්පත් කරන ලද රු.876,799 ක තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. තවද, එම තැන්පත් කිරීම් සඳහා අදාල විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

(අ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජාතික තරුණ සේවා සභාවේ පුහුණු පාඨමාලා සඳහා සම්බන්ධ කර තිබුණු ප්‍රතිලාභින් හත්දෙනෙකු පාඨමාලාව අවසන් නොකර හැරගොස් තිබුණි.මේ වෙනුවෙන් රු.29,550 ක් වැයකර තිබුණි.

(ආ) කලවාකැලේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනයේ දක්වා ඇති වැඩිහිටි, ආබාධිත හා වකුගඩු දිමනා ඉල්ලුම්කරුවන් 881 දෙනෙකු වෙනුවෙන් 2023 ජූලි හා අගෝස්තු මාසවලට අදාල රු.8,810,000 ක දිමනා ,අදාල ප්‍රතිලාභීන් දැනුවත් නොවීම මත ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිට එම මුදල රජයේ ආදායමට බැර කර තිබුණි.

(ඇ) ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාතිය යටතේ 2018 වර්ෂයේදී හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.6,900,000 ක් වැයකර බීජ බෝංචි ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් හා ශිතාගාරයක් ඉදිකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුණුගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභින් සඳහා රු.5,000 ක දීමනාවක් ලබාදීම වෙනුවෙන් රු.5,877,600 ක් අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබුණද එම මුදල් ප්‍රතිලාභීන්ට ලබා දීමකින්තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

(අ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගැටතුළාව නිළ නිවාසය අළුත් වැඩියා කිරිම යටතේ එම නිළ නිවාසයේ අභ්‍යන්තර නාන කාමරයක් ඉදිකිරිම වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී රු.382,101 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා ජල සැපයුම ලබා දිම සිදුකර නොතිබුණු බැවින් නාන කාමරය භාවිතයට ගැනීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණු අතර, ඉදිකර තිබුණු නාන කාමරය වෙත දීර්ස කාලයක සිට බාහිරින් මඩ සහ ජලය එකතුවී තිබුණි.

(ආ) නාය යැමේ අධි අවධානම් කලාපයක් ලෙස 2017 වර්ෂයේ හඳුනාගෙන තිබුණු අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හැටන්,සමනළගම ස්ථානයේ පවුල් 12 ක් එම ස්ථානයෙන් ඉවත් කිරීමට තීරණය කර ඉන් පවුල් 06 ක් සඳහා රජයේ ඉඩමක නිවාස ඉදිකිරීමට රු.6,300,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 06 ක් ගතවී ඇතත්, ඉදිකිරිම් කටයුතු අවසන් නොකර අතර මඟ නවතා තිබුණි.

(ඇ) 2022 මැයි 04 දිනැති අංක DMC/Miti/Pro/NuwaraEliya/2021/01 දරන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් වලපනේ ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ අවධානම අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට කටයුතු කර තිබුණු අතර, උක්ත ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.18,912,660ක් වැයකර තිබුණද,අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරිම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන ලද අරමුණු හා ප්‍රතිඵල ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(අ) රජය ලබාදෙන රුපියල් ලක්ෂ 04 ක මුදලින් ප්‍රතිලාභියා විසින් මිලදි ගන්නා ඉඩමක රජය විසින් ලබාදෙන මූල්‍යාධාර මත නිවාසයක් ඉදිකිරීමේ අවස්ථාව යටතේ, ආපදා සහන සේවා ඒකකය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අවධානම් ලෙස හඳුනාගත් පවුල් 159 ක් සඳහා නිවාස ඉදිකර නැවත පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද, ඉන් පවුල් 115 ක් එසේනැවත පදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.එසේම රජය විසින් ලබාදෙනු ලබන ඉඩමක රජයේ මූල්‍යාධාර වලින් නිවාස ඉදිකිරීමේ වැඩසටහන යටතේ, ආපදා සහන සේවා ඒකකය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පවුල් 970 ක් වර්තමාන පදිංචි ස්ථානයෙන් ඉවත් කර ආරක්ෂිත ස්ථානයන්හි පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද, ඉන් පවුල් 798 ක් ආරක්ෂිත ස්ථානයන්හි ස්ථාන ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යෑම් හා අධි අවධානම් තත්ත්වයන් හේතුවෙන් 2019 වර්ෂයේ ඉවත් කරනු ලැබු පවුල් 04 කට කළුගල මිල්ලගහමුල ප්‍රදේශයේ ඔවුන් විසින් මිලදි ගත් ඉඩමක නිවාස ඉදිකිරිම සහ ඉඩම මිලදි ගැනීම සඳහා රු.2,700,000 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරිම් මූලික අදියරේ පැවති අතර, ප්‍රගතිය සියයට 30 ක පමණ පහල මට්ටමක පැවතුණි.

(ඇ) ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත "සුවපහසු මූල්‍යාධාර" වැඩසටහනට අදාලව "වැඩිහිටියන්ට තම නිවස තුළ ජීවත්වීම සඳහා අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීම" ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ව්‍යාපෘති 10 ක් සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද ඉන් ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් රු.490,000 ක මුදලක් නිදහස් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එම

ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රගතිය සියයට 10 ත් සියයට 15 ත් අතර මට්ටමක පැවතුණි.ඊට අමතරව ඉතිරි ව්‍යාපෘති දෙකහි වැඩ කටයුතු ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.600,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

(අ) නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රු.4,383,929 ක ලොරි බවුසරය වසර 02 ක පමණ කාලයක සිට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් වටිනාකම හඳුනාගත නොහැකි වත්කම් 93 ක් වසර 01 සිට වසර 05 අතර කාලයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දොඩම්කුඹුර ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය සුරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා 2020 අගෝස්තු 31 දින රු.940,500 ක් හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**3.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

(අ) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක ඉන්ධන ටැංකියේ උපරිම ධාරිතාවය ලීටර් 80 ක් වුවද, එම ප්‍රමාණය ඉක්මවා අවස්ථා 72 දී ඉන්ධන ලීටර් 7,958 ක් ලබාගෙන තිබුණි. 2023 නොවැම්බර් 14 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාව අනුව, වාහනයේ ටැංකියේ ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 10 ක් වුවද, එදිනට ධාවන සටහන අනුව ටැංකියේ ඉතිරිව තිබෙන ඉන්ධන ප්‍රමාණය ලීටර් 298.54 වූයෙන් ඉන්ධන ලීටර් 288.54 ක් වෙනුවෙන් රු.101,313 ක (අවසන් වරට ඉන්ධන ලබාගත් මිල පදනම කරගෙන) අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි.

(ආ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 31 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට 2024 ජනවාරි දක්වා කාලය තුල ඉරිදා දිනවලදී නිවාඩු දින රාජකාරි ඉටු කිරීමේදී ඇඟිළි සළකුණු යන්ත්‍රය භාවිතාකර නොතිබියදී රු.227,425 ක් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි

(ඇ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි බැංකු මඟින් වැඩිහිටි දීමනා ගෙවීම කිරීමේදි සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට ජුනි මස දක්වා කාලය තුල මිය ගිය බව හදුනා නොගෙන මිය ගිය ප්‍රතිලාභීන් 7 දෙනෙකු වෙනුවෙන් රු.66,500 ක් පෞද්ගලික ගිණුම්වලට බැර කර තිබුණි.

(ඇ) තලවාකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේප්පුව තුල 2023 නොවැම්බර් 27 හා දෙසැම්බර් 12 අතර කාලය පරාසය තුල වකුගඩු, ආබාධිත හා වැඩිහිටි දීමනා ගෙවීම් වෙනුවෙන් ලැබී තිබුණු රු.14,510,000 ක් වටිනා රේඛනය අවලංගු කරන ලද විවෘත චෙක්පත් 6 ක් සහ රු.4,410,000 ක මුදල් සමඟ එකතුව රු.18,920,000 ක මුදල් හා චෙක්පත් ප්‍රතිලාභීන්ට නොගෙවා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 19 දින දක්වා සේප්පුවේ රඳවා ගෙන තිබුණි.

**3.4 පාඩු හා හානි**

නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් වාහනයක රු.25,000 ක අලාභයක් සිදුවී වසර 05 ක් ගතවී ඇතත්, සමාලෝචිතව වර්ෂය අවසාන දින වන විටත් මු.රෙ.104 (1) ප්‍රකාරව කටයුතු කර අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 කළමනාකරණ දුර්වලතා**

(අ) 2001 මාර්තු 23 දින විශ්‍රාම ලබා 2020 මැයි 30 දින මිය ගොස් ඇති ප්‍රතිලාභියෙකුගේ වැන්දඹු අනත්දරු, විශ්‍රාම වැටුප වසර 03 ක් ගතවී තිබුණද, නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් සකස් කර නොතිබුණි.

(ආ) අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් රු.140,985 කට මිලදීගත් ටෝනර් 15 ක් හා 2013 හා 2016 අතර කාලයකදී මිලදී ගෙන තිබුණු වටිනාකම හඳුනාගත නොහැකි ටෝනර් 16 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩා කර තිබුණි.

(ඇ) 1981 අංක 58 දරන සහ 1983 අංක 29 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ පනත අනුව අංක 04, වින්ඩ් කෝනර්, බිලැක්පූල් ලිපිනයේ පදිංචි අනවසර පදිංචිකරුවන් ඉවත් කර අදාල ඉඩමේ සන්තකය පවරා ගැනීමට නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 76818 දරන නඩුවට අදාලව 2006 නොවැම්බර් 28 දින ලබාදී තිබුණු තීන්දුව හා 2010 ඔක්තෝබර් 01 දින නුවරඑළිය මහාධිකරණය විසින් ලබාදී තිබුණු තීන්දුව අනුව, සන්තකය පවරා ගැනීමට 2024 මැයි වන විටත් කටයුතු කර නොතිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 සඳහා අනුමත කාර්මික සහ තාක්ෂණ සහයක නිලධාරීන් සංඛ්‍යාව 24 ක් වුවද, ඉන් තනතුරු 17 ක් පුරප්පාඩු වී පැවතුණු අතර අනුමත ග්‍රාම නිලධාරි සංඛ්‍යාව 491 ක් වුවද, පුරප්පාඩු 109 ක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන සම්බන්ධීකාරක තනතුරු 02 ක් අතිරික්තව පැවතුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැයුම් ප්‍රතිශතයක්(%)ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| **1. සැලසුම් අංශය** | | | |
| **<u>1.1කෘෂි වගාව</u>**<br>1.1 **කොස් වගා ව්‍යාපෘතිය (කොස් පැළ සිටුවීම)** | ✓ | | |
| 1.2 පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ✓ | | |
| 1.3 **පළතුරු වගා ව්‍යාපෘතිය**<br>1.3.1 පළතුරු පැළ සිටුවීම (ස්ට්‍රෝබෙරි/අඹ/පැණි<br>1.3.2 දොඩම්/කජු/පෙයාස්/අලිඅගුටපේර) | | | ✓ |
| 1.4 පුහුණු වැඩසටහන් පැවැත්වීම | | | ✓ |
| 1.5 **දේශීය අල වර්ග වගා කිරීමේ ව්‍යාපෘතිය**<br>1.5.1 දන්දිල/බූත්සරණ/සෙවල් අල/හුලංකිරිය/හිඟුරල | | ✓ | |
| 1.6 **ආනයන ආදේශක/ අපනයන ඉලක්ක කර භෝග වගා ව්‍යාපෘතිය.**<br>**1.6.1** කෝපි/ගම්මිරිස්/පුවක්/වැනිලා/කලු බුලත්/බීජ බෝංචි/ඒනසාල්/නයිමිරිස්/මී මැසි පාලනය | ✓ | | |
| 1.7 පුහුණු වැඩසටහන් පැවැත්වීම | ✓ | | |
| 1.8 **කිතුල් ආශ්‍රිත නිෂ්පාදන (පැළ සිටුවීම)** | ✓ | | |
| **<u>1.2 ආහාර විජලන කර්මාන්තය සංවර්ධනය කිරීම.</u>**<br>2.1 පුහුණු වැඩසටහන් ක්‍රියාතමක කිරිම | | | ✓ |
| 2.2 ගෘහ ආශ්‍රිතව විජලන කර්මාන්ත කරුවන් බිහි කිරිම | | | ✓ |
| 2.3 ආහාර විජලන කර්මාන්තයේ ව්‍යවසායකයින් බිහි කිරීම | | | ✓ |
| 2.3 විසිතුරු මසුන් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම | | | ✓ |
| **<u>1.3 අතිරේක භෝග අස්වැන්න හුවමාරුව සහ අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.</u>**<br>3.1 ආහාර සුරක්ෂිතාගාර පිහිටුවීම | | | ✓ |
| 3.2 රජයේ ආයතන තුල අලෙවි පොලවල් ක්‍රියාත්මක කිරීම | | | ✓ |
| 3.3 කුඩා ව්‍යාපාර අලෙවි පොලවල් ක්‍රියාත්මක කිරීම | | | ✓ |
| 3.4 රාජ්‍ය ආයතන වල සේවා ගමට ගෙන යාම | | | ✓ |
| 3.5 සංචාරක ආශ්‍රිත සේවා සපයන්නන් පුහුණු කිරීම | | | ✓ |
| 3.6 NVQ සහතික පත්‍ර ලබා ගැනීම සඳහා ප්‍රතිලාභීන් යොමු කිරීම | | | ✓ |
| 3.7 තොරතුරු තාක්ෂණය සඳහා වෘත්තිය පුහුණුව ලබා දීම | | | ✓ |
| **<u>1.4 පුද්ගලානුබද්ධ හා සමාජ සංවර්ධනය.</u>**<br>• **ආකල්ප සංවර්ධනය** | | | ✓ |

| | | | |
|---|---|---|---|
| 1. 4.1 පාසල් ළමුන් සඳහා වැඩසටහන් පැවැත්වීම | | | ✓ |
| 1.4.2 යෞවන සමාජ සඳහා වැඩසටහන් පැවැත්වීම | | | ✓ |
| 1.4.3 ළමා සමාජ සඳහා වැඩසටහන් පැවැත්වීම | | | ✓ |
| 1. 4.4 දහම් පැසල් ළමුන් සඳහා වැඩසටහන් පැවැත්වීම | | | ✓ |
| • **සමාජ සංවර්ධනය** | | | ✓ |
| 1.4.5 ළමා අපචාර හා කාන්තා හිංසනය සම්බන්ධ පවත්නා නීතිමය තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | | | ✓ |
| 1.4.6 ගම් ආශ්‍රිතව නීති විරෝධි මත්ද්‍රව්‍ය වැලැක්වීම සඳහා ඇනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම | | | ✓ |
| 1. 4.7 ගම් මට්ටමින් ශ්‍රමදාන පැවැත්වීම | | | ✓ |
| 1.4.8 ක්‍රීඩා සමිති ප්‍රමාණය වැඩි කිරීම | | | ✓ |
| 1. 4.9 යෞවන සමාජ ප්‍රමාණය වැඩි කිරීම | | | ✓ |
| 1.4.10 පෙර පාසල් නොයන දරුවන් අධ්‍යාපනය සඳහා යොමු කිරීම | | | ✓ |
| 1.4.11 උග්‍ර දරිද්‍රතාවයෙන් පෙලෙන සහනාධාර මත පමණක් යැපෙන කැපකරු යුතු බවට හඳුනාගත් පවුල් සඳහා කැපකරු සහය ක්‍රමයක් සකස් කිරීම. | | | ✓ |
| **1.5** <u>සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය</u> | | | ✓ |
| 1.5.1 හඟුරන්කෙත අත් යන්ත්‍ර පේෂ කර්ම නිෂ්පාදන ව්‍යාපෘතිය | | | ✓ |
| 1.5.2 අඹගමුව වෙන්වර් කිරි ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ව්‍යාපෘතිය | | | ✓ |
| 2. **ඉංජිනේරු අංශය** | | | |
| 2.1 දිසාපති මැදුරේ තීන්ත ආලේප කිරීම | ✓ | | |
| 2.2 අංක 21,22 උඩුපුස්සැල්ලාව පාර නුවරඑළිය පොදු සේවා නිවාසයේ වහලය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.3 අංක 40 ක්‍රේටන් විලේජ් පිහිටි පොදු සේවා නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.4 දිස්ත්‍රික් ඉංජිනේරු නිල නිවසේ ජනෙල් අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.5 අංක 07 රාහුල මාවත නුවරඑළිය පොදු සේවා නිවාස අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.6 ප්‍රධාන ගණකාධිකාරී නිල නිවස තීන්ත ආලේප කිරීම | ✓ | | |
| 2.7 රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ ශාලාවේ පිටුපස වහලය හා සිවිලිම අළුත්වැඩියා කිරීම | ✓ | | |

| | | | |
|---|---|---|---|
| 2.8 අංක 37 ක්‍රෝටන් විලේජ් පිහිටි පොදු සේවා නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.9 අංක 21 උඩුපුස්සැල්ලාව පාර පිහිටි පොදු සේවා නිවාසයේ වහල අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.10 අංක 19 උඩුපුස්සැල්ලාව පාර පිහිටි පොදු සේවා නිවාසයේ නාන කාමරය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.11 අංක 27 /A/1/1 ක්‍රෝටන් විලේජ් පිහිටි පොදු සේවා නිවාසය වහල අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.12 ප්‍ර ධාන අභ්‍යාන්තර විගණක නිල නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.13 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපන ශාලාවේ වයරිං අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.14 ක්‍රීඩා සමාජ ශාලාවේ වැසිකිළි වල වැසීමේ කම්කරු ගාස්තු ගෙවීම | ✓ | | |
| 2.15 රාහුල මාවත 05,06,07 (කණිෂ්ඨ සේවක) නිල නිවාසයන් හී වැසිකිළි අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.16 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචාරක නිවාසය පිහිටි ස්ථානයේ පැති බැම්ම අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.17 අංක 32,33 ක්‍රෝටන් විලේජ් පොදු සේවා නිවාසයන්හී ගේට්ටු ඉදිකිරීම | ✓ | | |
| 2.18 ගබඩා භාරකරු නිල නිවාසයේ තීන්ත ආලේප කිරීම | ✓ | | |
| 2.19 දිස්ත්‍රික් ඉංජිනේරු නිල නිවසේ පැති බැම්ම ඉදි කිරීම | ✓ | | |
| 2.20 අක 31 ජයතිලක මාවත කාන්තා සාද නිවාසයේ අළුත්වැඩියාව | ✓ | | |
| 2.21 අංක 42 ක්‍රෝටන් විලේජ් පිහිටි පොදු සේවා නිවාසයේ වහල අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.22 අංක 42 ක්‍රෝටන් විලේජ් පිහිටි පොදු සේවා නිවාසයේ තීන්ත ආලේප කිරීම | ✓ | | |
| 2.23 අංක 19,20,21,22,23,24,25 උඩුපුස්සැල්ලාව පාර නුවරඑළිය පිහිටි පොදු සේවා නිවාස වල කාණු පද්ධතිය ඉදි කිරීම. | ✓ | | |
| 2.24 අංක 36 ක්‍රෝටන් විලේජ් නිල නිවාසට අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.25 අංක 14 උඩුපුස්සැල්ලාව පාර පිහිටි පොදු සේවා නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.26 අතිරේක දිස්ත්‍රික් ලේකම් නිල නිවාස අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.27 සහකාර දිස්ත්‍රික් ලේකම්ගේ නිල නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |

| | | | |
|---|---|---|---|
| 2.28 දිසාපති මැදුර අළුත්වැඩියා කිරීම - 2023 | ✓ | | |
| 2.29 අංක 16 උඩුපුස්සැල්ලාව පාර පිහිටි පොදු සේවා නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.30 දිස්ත්‍රික් ඉංජිනේරු නිල නිවාසය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.31 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.32 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා නිල නිවාස ඉදි කිරීම අදියර - 11 (බිම් මහල) | ✓ | | |
| 2.33 උප්පැන්,මරණ හා විවාහ සහතික නිකුත් කරන ලේඛනාගාරයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.34 සංචාරක බංගලාවේ නාන කාමරය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.35 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචාරක බංගලාව අළුත්වැඩියා කිරීම | ✓ | | |
| 2.36 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචාරක බංගලාව කාපට් යෙදීම | ✓ | | |
| 2.37 ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සංචාරක බංගලාවේ අපජල පද්ධතිය අළුත්වැඩියා කිරීම | ✓ | | |
| **03. සමාජ සේවා අංශය** | | | |
| 3.1 ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය ප්‍රතිසාධන අදාර ව්‍යාපෘතිය යටතේ අබාධ සහිත තැනැත්තන් සඳහා ජංගම අලෙවි කරත්ත ලබා දීමේ වැඩසටහන | ✓ | | |
| 3.2 ජපන් ජයිකා ආයතනය, සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ මිනිස් බල හා රැකීරක්ෂා අමාතයාංශය සමඟ ඒක්ව දියත් කරන බාධ සහිත පුද්ගලයින් රැකියා ගත කිරීමේ (ESPD) ව්‍යාපෘතිය | ✓ | | |
| 3.3 අබාධ සහිත පුද්ගලයින් වෘත්තීය පුහුණුව සඳහා යොමු කල අය අතරින් සාර්ථකව නිම කළ සංඛ්‍යාව | ✓ | | |
| 3.4 ආබාධ සහිත තැනැත්තන් හට නිවාස ආධාර ලබා දීම | ✓ | | |
| 3.5 අබාධ සහිත ජනතාව සඳහා උපරිම 40,000 වන පරිද ස්වයං රැකියා අධාර ලබා දීම | ✓ | | |
| 3.6 වැඩිහිටියන්ගේ සුභ සාධනය සඳහා වන ජාතික අරමුදල මගින් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රථම අධියර - නුවරඑළිය) | ✓ | | |
| 3.7 වැඩිහිටියන්ගේ සුභ සාධනය සඳහා වන ජාතික අරමුදල මගින් වැඩිහිටියන් සඳහා නිවාස ඉදිකිරීම - දිරිය පියස ව්‍යාපෘතිය දිවා මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රථම අදියර - නුවරඑළිය) | ✓ | | |

| | | | |
|---|---|---|---|
| 3.8 වැඩිහිටියන්ගේ සුභසාධනය සඳහා ස්වයං රැකියා අධාර ලබා දීම. (10 දෙනෙකු සඳහා) | ✓ | | |
| 3.9 වැඩිහිටියන්ගේ සුභ සාධනය සඳහා වන ජාතික අරමුදල මගින් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන වලට උපකරණ මිලදී ගැනීම සඳහා අරමුදල් නිදහස් කිරීම | ✓ | | |
| 3.10 වැඩිහිටියන්ට තම නිවස තුල ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම. | ✓ | | |
| 3.11 වැඩිහිටියන් සඳහා වැලදී තිබෙන පිළිකා, වකු ගඩු, හෘද රෝග, ස්නායු රෝග, පෙනහළු, අක්මාව, අන්ත්‍රය ආශ්‍රිත රෝග, පූර්ණ අන්ධ භාවය, පේෂි හා සන්ධි රෝග, අංශභාගය ආදී රෝග සඳහා ලබා දෙන ආරෝග්‍ය වැඩිහිටි මූල්‍යාධාර වැඩසටහන | ✓ | | |
| 3.12 වයස අවුරුදු 60 සම්පූර්ණ වූ අඩු ආදායම් ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා අක්ෂිකාච, ඇස් කණ්ණාඩි, සහ ශ්‍රවණ උපකරණ ලබා දීම | ✓ | | |
| 3.13 වැඩිහිටි වන්දනා චාරිකා වෙනුවෙන් රු.75,000 උපරිමයකට යටත්ව අධාර මුදල් ලබා දීම | ✓ | | |
| 3.14 පාසල් ළමුන් සඳහා වැඩිහිටියන් පිළිබඳ අවබෝධයක් ලබා දීමත් වැඩිහිටි භාවය පිළිබඳ යහපත් දැක්මක් හා අන්තර් සම්බන්ධතාවය ගොඩනැගීමේ අරමුණින් ක්‍රියාත්මක කරන "ළමා ලෝකයයි වැඩිහිටි වියයි" පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන දිස්ත්‍රික්කයට 01 බැගින් ක්‍රියාත්මක කරන වැඩසටහන | ✓ | | |
| **4 කුඩා ව්‍යාපාර අංශය** | | | |
| 4.1 නව ව්‍යාපාර ආරම්භ කිරීම | | | ✓ |
| 4.2 පවත්නා ව්‍යාපාර සංවර්ධනය කිරීම | | | ✓ |
| 4.3 අළෙවි සම්බන්ධතා ඇති කිරීම | | | ✓ |
| 4.4 තනි පුද්ගල තාක්ෂණය ලබා දීම | ✓ | | |
| 4.5 කණ්ඩායම් පුහුණු තාක්ෂණ වැඩසටහන් | ✓ | | |
| 4.6 ඇසුරුම්කරණය | | | ✓ |
| 4.7 ව්‍යාපාර ලියාපදිංචිය | ✓ | | |
| 4.8 පිරිවැයකරණය | ✓ | | |
| 4.9 ව්‍යාපාර සැළසුම් කිරීම | ✓ | | |
| **5 සංස්කෘතික /බෞද්ධ කටයුතු / මුස්ලිම් කටයුතු අංශය** | | | |
| 5.1 සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම | ✓ | | |
| 5.2 දොලොස්මහේ පහන වැඩසටහන | ✓ | | |
| 5.3 කලාකරුවන් සඳහා අධාර මුදල් ලබා දීම | ✓ | | |
| 5.4 කලාකරු වෛද්‍යාධාර ගෙවීමේ වැඩසටහන | ✓ | | |

| | | | |
|---|---|---|---|
| 5.5 කලාකරු මරණාධාර ගෙවීමේ වැඩසටහන | ✓ | | |
| 5.6 වයෝවෘධ කලාකරු ආධාර ගෙවීමේ වැඩසටහන | ✓ | | |
| 5.7 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සාහිත්‍ය තරඟ හා සාහිත්‍ය උත්සව පැවැත්වීම | ✓ | | |
| 5.8 මුස්ලිම් සංස්කෘතික රාමසාන් උළෙල පැවැත්වීම | ✓ | | |
| 5.9 දහම් පාසල් සමීක්ෂණය හා දහම් පාසල් ගුරු දීමනා ගෙවීම | ✓ | | |
| 5.10 මුස්ලිම් පල්ලි හා දහම් පාසල් ලියාපදිංචි කිරීම | | | ✓ |
| 5.11 මවුලවිවරුන්ට හැඳුනුම්පත් ලබා දීම | | | ✓ |
| 5.12 පල්ලිවල දායක සභා පත් කිරීම | | ✓ | |
| 5.13 පල්ලිවල ගිණුම් වාර්තා පරීක්ෂා කිරීම | ✓ | | |
| 5.14 පල්ලි දෙපල/කාර්යය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම | ✓ | | |
| 5.15 හජ් වන්දනාකරුවන් සම්බන්ධ කිරීම | ✓ | | |
| 06 ඉඩම් අංශය | | | |
| 6.1 <u>ඉඩම් ගැටළු විසඳීම</u><br>6.1.1 නුවරඑළිය, තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ✓ | | |
| 6.1.2 හඟුරන්කෙත, මතුරට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ✓ | | |
| 6.1.3 අඹගමුව, නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ✓ | | |
| 6.1.4 කොත්මලේ, තිස්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ✓ | | |
| 6.1.5වලපනේ, නිල්දණ්ඩාහින්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ✓ | | |
| **7.ඵලදායිතා අංශය** | | | |
| 7.1 සුහුරු ව්‍යවසායකයෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක වැඩසටහන | | ✓ | |
| 7.2 රාජ්‍ය අංශයේ ක්‍රියාවල් වැඩිදියුණු කිරීම | | ✓ | |
| 7.3 ඵලදායිතාව හා නව්‍යකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ✓ | | |
| 7.4 පෙර පාසල් හා පාසල් සඳහා ඵලදායිතා සංකල්පය හඳුන්වා දීම | ✓ | | |
| **8. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය** | | | |
| **8.1** <u>**කෘෂි සංවර්ධන වැඩසටහන්**</u><br>8.1.1 දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව පැවැත්වීම | ✓ | | |
| 8.1.2 ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව පැවැත්වීම | ✓ | | |

| | | | |
|---|---|---|---|
| 8.1.3. දිස්ත්‍රික් පොහොර කමිටුව පැවැත්වීම | ✓ | | |
| **8.2කෘෂි තොරතුරු ලබා ගැනීම**<br><br>8.2.1 බෝග නිෂ්පාදන සැලැස්ම | ✓ | | |
| 8.2.2 වී වගාව පිළිබඳ තොරතුරු, සතිපතා වාර්තා ලබා ගැනීම | ✓ | | |
| 8.2.3 බෝග විශ්ලේෂණ වාර්තා ලබා ගැනීම | ✓ | | |
| 8.2.4 කෘෂි යෙදවුම් මිල සැසඳුම් වාර්තාව | | ✓ | |
| 8.2.5 දෛනික එළවළු මිල විශ්ලේෂණය | ✓ | | |
| 8.2.6 කෘෂිකාර්මික කටයුතු බාධාවකින් තොරව සිදු කර ගැනීම සඳහා ඉන්ධන අවශ්‍යතාවය ලබා ගැනීම | ✓ | | |
| 8.2ලැබෙන ලිපි සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම | ✓ | | |
| **8.3** දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන කෘෂි ව්‍යාපෘති වලට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම | ✓ | | |
| **8.4** පොහොර සහනාධාරය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ✓ | | |
| **8.5** රාජ්‍ය නොවන සංවිධාන අධාර යටතේ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන කෘෂි වැඩසටහන් සඳහා සහයෝගය ලබා දීම. | ✓ | | |
| **8.6** බෝග සඳහා නිෂ්පාදන පිරිවැය සැකසීම හා ආර්ථික මධ්‍යස්ථාන හරහා මිල ගණන් නියාමනයට මැදිහත් වීම | ✓ | | |
| **8.7** විවිධ කෘෂිකාර්මික ව්‍යාපෘති සිදු කිරීමේදී අදාල ආයතන සම්බන්ධීකරණය | ✓ | | |
| **8.8** දිස්ත්‍රික් ලේකම්තුමා විසින් අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරි කටයුතු සිදු කිරීම | ✓ | | |
| **9 ආපදා සහන සේවා අංශය** | | | |
| 9.1 පිසූ ආහාර /වියළි සලාක/මරණාධාර වන්දි/හදිසි ප්‍රතිපාදන ගෙවීම | ✓ | | |
| 9.2 නිවාස හානි වන්දි ගෙවීම | ✓ | | |
| 9.3 නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාස ඉදි කිරීම | ✓ | | |
| **10 ළමා ආරක්ෂක අංශය** | | | |
| 11.1 ළමා ආරක්ෂක සඳහා වන ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන | ✓ | | |
| 11.2 ළමා ආරක්ෂක සඳහා වන ශිෂ්‍ය තානාපති සමුළුව පැවැත්වීම | ✓ | | |
| 11.3 සිතුවිලි සිත්තම - 2022 චිත්‍ර තරඟය | ✓ | | |
| 11.4 ආගමික පූජ්‍ය ප්‍රසාදීන් දැනුවත් කිරීමේ වැඩසටහන | ✓ | | |

| | | | |
|---|---|---|---|
| 11.5 නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | ✓ | | |
| 11.6 මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම | ✓ | | |
| 11.7 හදිසි ආපදා තත්වයන්හි දී ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ වැඩසටහන | ✓ | | |
| 11.8 ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය | ✓ | | |
| 11.9 ළමා ආරක්ෂණය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨ දැනුවත් කිරීමේ වැඩසටහන | ✓ | | |
| 11.10 ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය | ✓ | | |
| **11 සමාජ ආරක්ෂණ අංශය** | ✓ | | |
| 11.1 සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට නව සාමාජිකයින් බඳවා ගැනීම | ✓ | | |
| 11.2 නව සාමාජිකයින් බඳවා ගැනීමේ පළමු වාරික මුදල් රැස්කිරීම | ✓ | | |
| **12 භාෂා පරිවර්තන අශය** | ✓ | | |
| 12.1 භාෂා පරිවර්තනය සඳහා අංශය වෙත ලබා දෙන සියළුම ලිපි ලේඛන සහ පරිගණක ඉදිරිපත් කිරීම නිසි වේලාවට ප්‍රමාද නොකර පරිවර්ථනය කර භාර දීම. | ✓ | | |
| **13 Helping Nuwara eliya** වැඩසටහන | | | |
| 13.1 අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දරුවන් 30 සඳහා පාසල් උපකරණ ලබා දීම. | ✓ | | ✓ |
| 13.2 අඹගමුව ගෝනාවල විද්‍යාලයේ දරුවන් 100 දෙනෙකු සඳහා පාසල් උපකරණ හා සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම හා දන්ත සායන වැඩසටහනක් පැවැත්වීම | ✓ | | ✓ |
| 13.3 වැඩිහිටි පුද්ගලයින් 1000 ක් සඳහා අක්ෂිසායන වැඩමුළුවක් පවත්වා උපැස් යුවල් 1000 ක් ලබා දීම | ✓ | | ✓ |
| 13.4 වෛද්‍ය සායනය වැඩමුළුවක් පැවැත්වීම | ✓ | | ✓ |
| 13.5 දන්ත සායන වැඩමුළුවක් පැවැත්වීම | ✓ | | ✓ |
| 13.6 ගැබිණිමව්වරු සඳහා උපදේශන වැඩමුළුවක් පවත්වා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රදානය කිරීම | ✓ | | ✓ |
| 13.7 කාර්යාල නිලධාරීන් සඳහා ව්‍යවසාය සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම | ✓ | | ✓ |
| 13.8 හඟුරන්කෙත ඇකිරිය විද්‍යාලයේ දරුවන් සඳහා පාසල් උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ ප්‍රදානය කිරීම. | ✓ | | ✓ |

| | | | |
|---|---|---|---|
| 13.9 කොත්මලේ මා වෙල විද්‍යාලයේ දරුවන් 268ක් සඳහා පාසල් උපකරණ සහ ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.(ලක්ෂ 32ක් වටිනා පාසල් උපකරණ සහ ලක්ෂ 4ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ) | ✓ | | ✓ |
| 13.10. වලපනේ යටි මාදුර ප්‍රාථමික විද්‍යාලයේ දරුවන් සඳහා ලක්ෂ 07 ක් වටිනා පාසල් උපකරණ සහ රු.215,000 ක් වටිනා වියළි ආහාර ලබා දීම. | ✓ | | ✓ |
| 13.11 කොත්මලේ මා වෙල විද්‍යාලයේ ක්‍රීඩා සිසුන් සඳහා වෛද්‍ය සායන වැඩසටහනක් පැවැත්වීම. | ✓ | | ✓ |
| **14 අභ්‍යන්තර විගණන අංශය** | | | |
| 14.1 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.2 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.3 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.4 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.5 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - නෝර්වුඩ් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.6 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.7 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.8 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - වලපනේ නගරයේ උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.9 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| 14.10 අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - මතුරට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ✓ | | ✓ |
| **15 වනිතා කටයුතු අංශය** | | | |
| 15.1 ශුද්ධ මූල්‍ය ණය වලින් පීඩාවට පත් කාන්තාවන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම. | | | ✓ |

| | | | |
|---|---|---|---|
| 15.2 වතු අංශයේ කාන්තාවන් සවි බල ගැන්වීමේ වැඩසටහන | ✓ | | ✓ |
| 15.3 ආර්ථික අපහසුතා අවම කර ගැනීම සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම. | ✓ | | ✓ |
| **16 මුල් ළමාවිය සංවර්ධන අංශය** | ✓ | | ✓ |
| 16.1 ගර්භනී මව්වරුන් සඳහා ලබා දෙන පෝෂණ මල්ල වැඩසටහන | ✓ | | ✓ |
| 16.2 පෙර පාසල් ළමුන් සඳහා ලබා දෙන උදෑසන ආහාරවේල වැඩසටහන | | | ✓ |
| 16.3 යුනිසෙෆ් ආධාර මත වතු ආශ්‍රිත පෙර පාසල් ළමුන් සඳහා ලබා දෙන උදෑසන ආහාර වේල වැඩසටහන | ✓ | | ✓ |
| 16.4 පෙර පාසල් ගුරුවරුන් සඳහා ලබා දෙන ගුරු අභිමාණී දීමනාව | ✓ | | ✓ |
| **17 ළමා හිමිකම් අංශය** | | | |
| 17.1 ධාරිතා සංවර්ධන වැඩසටහන | ✓ | | ✓ |
| 17.2 ළමා සමාජ ආපදා අවමකරණ වැඩසටහන | ✓ | | ✓ |
| 17.3 දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන | ✓ | | ✓ |
| 17.4 ළමා සංවර්ධන කමිටු වැඩසටහ | ✓ | | ✓ |
| 17.5 ළමා සභා වැඩසටහන | ✓ | | ✓ |
| 17.6 ආධාර වැඩසටහන | ✓ | | ✓ |
| 17.7 ආරක්ෂණ සැළසුම් | ✓ | | ✓ |
| 17.8 ආන්ත්‍ර ප්‍රජාවේ ජනතාව වෙනුවෙන් ජංගම සේවා පැවැත්වීම | ✓ | | ✓ |
| 17.9 ළමා සමාජ වැඩසටහන | ✓ | | ✓ |
| 17.10 ලෝක ළමා දින වැඩසටහන | ✓ | | ✓ |

## 05. පරිච්ඡේදය- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක ( වැඩසටහන්/ නිමකිරිමට අපේක්ෂිත ව්‍යාපෘති සංඛ්‍යාව) | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 1 දරිද්‍රතාවයෙන් තොරවීම | කොස් වගා ව්‍යාපෘතිය,පලතුරු වගා ව්‍යාපෘතිය, | නිම කළ ප්‍රතිශතය | | | ✓ |
| 2 කුසගින්න තුරන්කිරීම | කොස් වගා ව්‍යාපෘතිය,පලතුරු වගා ව්‍යාපෘතිය, | නිම කළ ප්‍රතිශතය | | | ✓ |
| 3 නිරෝගී බව හා යහපැවැත්ම | වෛද්‍ය සායන ,දන්ත සායන,ගැබිණිමව්වරුන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම හා උපදේශන වැඩමුළු පැවැත්වීම | පැවැත් වූ සායන/වැඩමුළු සංඛ්‍යාව | | | ✓ |
| 4 ගුණාත්මක අධ්‍යාපනය | පාසැල් දරුවන් සඳහා පාසැල් උපකරණ ලබා දීම | ආවරණය කල පාසැල් ළමුන් සංඛ්‍යාව | | | ✓ |
| 6 පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව | පාසැල් දරුවන් සඳහා සනිපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීම | ආවරණය කල පාසැල් ළමුන් සංඛ්‍යාව | | | ✓ |
| 9 කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම් | නව ව්‍යාපාර ආරම්භ කිරීම, අඹගමුව වෙන්චර් කිරි ආශ්‍රිත සෞභාග්‍යා නිෂ්පාදන ව්‍යාපෘතිය, හඟුරන්කෙත අත් යන්ත්‍ර පේෂ කර්ම න්ෂ්පාදන ව්‍යාපෘතිය | ආවරණය වූ පවුල් සංඛ්‍යාව | | | ✓ |

### 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

1.2.1 **ලඟා කර ගැනීම්**

**"නුවරඑළියට වසන්තය"** වැඩසටහන යටතේ ඇති ව්‍යාපෘතියක් වන "Helping Nuwara Eliya" වැඩසටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා උදව් කිරීමට කැමති හා හැකියාවක් ඇති පුද්ගලයන් හා ආයතන සම්බන්ධකර ගැනීම හා සහයෝගය අවශ්‍ය පාර්ශව වෙත සම්බන්ධ කිරීමේ කටයුතු සිදුකිරීම

1.2.2 **අභියෝග**

1 ප්‍රශස්ත අධ්‍යාපනයක් සඳහා ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් හිඟකම

2 භෞතික තත්වය,දේශගුණික තත්වය හා අඩු ආදායම් මට්ටම වැනි හේතුන් නිසා මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම. (විශේෂයෙන්ම කාන්තාවන්).

3 වතු ප්‍රදේශවල ළමා හා ගර්භනී මව්වරුන්ගේ මන්දපෝෂණය හා පෝෂණය පිළිබඳ අඩු අවධානය

4 සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය හා ඇස්තමේන්තු සකස් කිරීම සඳහා තාක්ෂණික නිලධාරින්ගේ හිඟය.

## 06 පරිච්ඡේදය-මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු /(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 54 | 34 | 20 |
| තෘතීයික | 43 | 14 | 29 |
| ද්විතියික | 1427 | 1204 | 225 /2** |
| ප්‍රාථමික | 96 | 84 | 12 |
| **එකතුව** | **1620** | **1336** | **286/ 2**** |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/ගණකාධිකාරී සේවයේ සහ සැලසුම් සේවයේ නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් පරිපාලන,ගිණුම්කරණ හා සැලසුම්කරණ කටයුතු සිදුකිරිමේ අපහසුව
2. තාක්ෂණික නිලධාරින්ගේ(සිවිල්)හිඟය හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අඩු වීම.
3. රියදුරන්ගේ හිඟය නිසා රාජකාරී කටයුතු කිරීමේ අපහසුතාවය

## 6.3 මානව සම්පත් සංවර්ධනය

### වර්ෂය තුල පැවැත් වූ පුහුණු වැඩසටහන්

| අනු අංකය | පාඨමාලාව | නිලධාරී කාණ්ඩය | සහභාගී වූ ප්‍රමාණය | පැවැත්වූ දිනය | පැවැත්වූ දින ගණන | වියදම |
|---|---|---|---|---|---|---|
| 1. | ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 30 | 2023.02.02 | 01 | එක්සත් මානව හිමිකම් සංවිධානය |
| 2. | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 20 | 2023.02.01 පෙ.ව 9.00- ප.ව 12.00 | 01 | 8500.00 |
| 3. | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 20 | 2023.02.01 ප.ව 1.00- ප.ව 4.00 | 01 | 8500.00 |
| 4. | තත්ත්වකව පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 35 | 2023.02.13 | 01 | 4200.00 |
| 5. | Australia awards scholarships for study commencing 2024 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය සහ වෙනත් රාජ්‍ය ආයතන | 35 | 2023.03.22 | 01 | - |
| 6. | ව්‍යවසායකත්වය සඳහා අභිප්‍රේරණ වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 35 | 2023.07.05 | 01 | 4200.00 |
| 7. | කළමනාකරණ සහකාර සේවයේ (කළමනාකරණ සේවා නිලධාරි සේවයේ) පළමු පන්තියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීම සඳහා පවත්වන දස දින පුහුණු වැඩමුළුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය සහ වෙනත් රාජ්‍ය ආයතන | 61 | 2023.07.10 සිට 2023.07.21 දක්වා | 10 | 155,000.00 |
| 8. | රාජකාරි කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 35 | 2023.09.08 | 01 | 5,600.00 |

| අනු අංකය | පාඨමාලාව | නිලධාරී කාණ්ඩය | සහභාගී වූ ප්‍රමාණය | පැවැත්වූ දිනය | පැවැත්වූ දින ගණන | වියදම |
|---|---|---|---|---|---|---|
| 9. | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන දූෂණ විරෝදී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | අතිරේක දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරු | 08 | 2023.09.15 සිට 2023.09.17 | 03 | - |
| 10. | සුපිළිපන්න නිලධාරීන් පත් කිරීම හා සුපිළිපන්න නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන | දිස්ත්‍රික් පරිපාලන නිලධාරි,සහකාර ප්‍රාදේශීය ලේකම්වරු | 08 | 2023.09.16 | 01 | - |
| 11. | ඵලදායිතාවය හා අභිප්‍රේරණය පිළිබඳ පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නිලධාරීන් | 80 | 2023.11.15 | 01 | 23,800.00 |
| 12. | පුද්ගල සංවර්ධන වැඩසටහන - මානව සම්පත් කළමනාකරණයට චිත්තවේග බුද්ධිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සියලුම ප්‍රාදේශීය ලේකම්වරු/සහකාර ප්‍රාදේශීය ලේකම්වරු/සැලසුම් සහකාර අධ්‍යක්ෂකවරු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය නිලධාරීන් | 100 | 2023.11.23 | 01 | 80,400.00 |
| 13. | රජයේ වැටුප් පරිවර්තන පිළිබඳ පුහුණු වැඩසටහන | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කළමනාකරණ සේවා නිලධාරි | 80 | 2023.11.30 | 01 | 49,560.00 |
| 14. | 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් | 75 | 2023.12.21 | 01 | 46,650.00 |
| | එකතුව | | | | | **386,410.00** |

## 07 පරිච්ඡේදය -අනුකූල වාර්තාව

| අංක | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූල තත්වය (අනුකූලවේ /අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | ✓ | | |
| 1.1 | වාර්ෂික මුල්‍ය ප්‍රකාශ | ✓ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | | ✓ | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | | ✓ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | ✓ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | ✓ | |
| 1.6 | වෙනත් | | - | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | ✓ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.9 | හානිපාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| **3** | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම(මු.රෙ.135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | ✓ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | ✓ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | ✓ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | ✓ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම | ✓ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශ නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | ✓ | | නියමිත දිනට පිළිතුරු සැපයිය හැකි විමසුම් සියල්ල සඳහා පිළිතුරු යවා ඇත.අනෙකුත් ඒවා සඳහා නියමිත කාලය තුල ඉදිරියේ දි සිදු කරයි. |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | ✓ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | ✓ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරන කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | ✓ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමික්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | ✓ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | | ✓ | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම | ✓ | | අපහරණය කළ යුතු වාහන වල ලියාපදිංචි සහතික නොබැති බැවින් පොත් සකසීමට ලබා දී ඇත. අපහරණ කටයුතු සිදිකරමින් පවති. |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යවත්කාලීන කර පවත්වාගෙන යාම | ✓ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්හන්ධයෙන් ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | ✓ | | |
| 9.5 | 2016.12.29. දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්දන දහනය වීම නැවත පරික්ෂා කිරීම | x | | ඉන්ධන සලාක ක්‍රමය අනුව පරික්ෂි කිරීමට නොහැකි වී ඇත |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | කල් බදු වාහන නොමැත | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | ✓ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා ගැලපුම් කළ යුතුව තිබු ශේෂ සම්හන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසික කාලයක් අතුළත නිරවුල් කර තිබීම | ✓ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබු ප්‍රතිපාදන එවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | ✓ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව සළසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිසම්පාදන සීමාව නොඉක්මන පරිදී බැරකම් වලට එලඹීම | | | ✓ |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | ✓ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම | ✓ | | |
| 12.3 | වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | ✓ | | මෙම ණය අයකර ගැනීම සඳහා නිත්‍යානුකූලව කටයුතු කෙරේ |
| **13** | **පොදු තැම්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | ✓ | | |
| 13.2 | පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | ✓ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලොචිත වර්ෂ අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | ✓ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | | | ✓ |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | ✓ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | ✓ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | ✓ | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කොට තිබූ අදායම් තැම්පතු ගිණුමට බැර නොකට සෘජුවම ආදායමට බැර කොට තිබීම | ✓ | | |
| 15.3 | මු . රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | ✓ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සමාජිකයන් වෙත රජකාරී ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම | ✓ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | ✓ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීනකරගෙන යාම | ✓ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංසා චෝදනා පල කිරීම ට පහසුකම් සලසා තිබීම | ✓ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වෙනි වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වර්තා ඉදිරිපත් කොට තිබීම | ✓ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | ✓ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | ✓ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව හිමිකම් සැලැස්මක් සකස් කොට තිබීම | ✓ | | මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | ✓ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | ✓ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම | ✓ | | |
| **20** | **විගණන ඡේද වලය ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවරදි කොට තිබීම | ✓ | | බොහෝමයක් ඡේද නිවැරදි කරමින් ඇති අතර,අනෙකුත් ඡේද සඳහා ක්‍රයාත්මක වෙමින් පවති |